-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ("අධිකාරිය") සහ අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම්හි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 13 (SLFRS 13) හි 76 වගන්තිය අනුව වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ අගයකින් මනිනු ලබන මූල්‍ය වත්කම් හඳුනාගැනීමේදී පළමු මට්ටම (Level 01) යටතේ වර්ග කිරීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොල මිලක් පැවතිය යුතු නමුත්, අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.5.4 ට අනුව වෙළඳපොල මිලක් නොමැති ලැයිස්තුගත නොකළ නව සමාගමක් වන කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් සමාගම (Colombo West International Terminal Pvt Ltd) පළමු මට්ටම යටතේ වර්ග කර හෙළිදරව් කර තිබුණි. | එකඟ වේ. ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කලම්බු වෙස්ට් ඉන්ටර්නැෂනල් ටර්මිනල් සමාගම (CWIT) හි සාධාරණ වටිනාකම මනිනු ලබන මූල්‍ය වත්කම් හඳුනාගැනීමේ දී තුන්වන මට්ටම යටතේ (Level 03) වර්ගීකරණය කිරීම තුලින් නිවැරදි කිරීම කරනු ලැබේ. | ප්‍රමිතය ප්‍රකාරව අදාළ මට්ටම යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 (LKAS 16) හි 51 වන වගන්තිය අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කර වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ගිණුම්වලට ගැලපුම් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියෙහි ගාල්ල වරාය සතුව පැවති ධාරණ අගය රු. මිලියන 4,365 ක් වූ වර්ග 11 කට අයත් වත්කම් සමාලෝචනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ගාල්ල වරායේ යාන්ත්‍රික, මෙහෙයුම් හා නාවික අංශයන්හි පවතින වත්කම් ඇගයීම සඳහා මෙහෙයුම් කළමනාකරු, යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු සහ නියෝජ්‍ය හාබර් මාස්ටර් (ගාල්ල) යන නිළධාරීන්ගෙන් යුත් කමිටුවක් මගින් ගාල්ල වරායේ වත්කම් ඇගයීම සිදු කරනු ලබන අතර එහි වාර්තාව ලද පසු අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම්වල ඵලදායි ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 (LKAS 21) හි 21 වගන්තිය අනුව විදේශ මුදලින් වන ගනුදෙනු, ගනුදෙනු සිදුවන අවස්ථාවේ පැවති එතැන් විනිමය අනුපාතය (Spot Rate) යොදාගනිමින් දේශීය මුදලට පරිවර්තනය කළ යුතුය. එසේ වුවද, අධිකාරිය විසින් ආදායම් හඳුනාගැනීමේදී එතැන් විනිමය අනුපාතයේ මිලට ගැනුම් අනුපාතය (Buying Rate) යොදාගැනීම වෙනුවට, වැඩි අගයක් සහිත විකුණුම් අනුපාතය (Selling Rate) යොදාගෙන තිබීම | එකඟ නොවේ. වරාය අධිකාරියේ ගාස්තු ලේඛන (Port Tariff) ඇමරිකානු ඩොලර් (USD) මුදල් ඒකකය අනුව සකස් කර ඇති අතර ලබාදෙනු ලබන සේවාවන් සඳහා ගාස්තු සකස් කර අවසානයේ ඇමරිකානු ඩොලරයේ විකුණුම් අනුපාතය අනුව දේශීය මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. වරාය අධිකාරිය මඟින් ලබාදෙනු ලබන සේවාවන් සඳහා ඉන්වොයිස් පත් | අධිකාරිය විසින් ආදායම් හඳුනාගැනීමේදී එතැන් විනිමය අනුපාතයේ මිලට ගැනුම් අනුපාතය (Buying Rate) යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිසා අධිකාරියේ ආදායම අධිතක්සේරු වී තිබුණි. | දේශීය මුදල් ඒකක බවට පරිවර්තනය කිරීමට ඇමරිකානු ඩොලරයේ විකුණුම් අනුපාතය පදනම් කරගෙන ගණනය කිරීම දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කරන ලද ක්‍රමවේදයක් වන අතර, ඒ සඳහා දේශිය නැව් නියෝජිත ආයතන ඔවුන් පිහිටුවා ගෙන ඇති සංවිධාන (CASA, SLAVO) වැනි ආයතන හෝ නැව් නියෝජිතයන්ගේ මූලස්ථාන (Principals) කිසිම අවස්ථාවක විරුද්ධත්වයක් ප්‍රකාශ කර නොමැත. | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 (LKAS 21) හි 23 (අ) වගන්තිය අනුව ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේදී විදේශ මුදලින් වන මූල්‍ය වත්කම් හඳුනාගැනීමේදී වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දිනට පැවති “අවසාන විනිමය අනුපාතය” (Closing rate) භාවිතා කර දේශීය මුදලට පරිවර්තනය කළ යුතු වුවද, අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට ණයගැති වටිනාකම වාර්තා කිරීමේදී එක් එක් ණයගැතියාගේ නිරවුල් නොවූ බිල්පත්වල රුපියල් වටිනාකම බිල්පත් දිනට පැවති විනිමය අනුපාතය යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් ණයගැති වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය නිරූපණය නොවුණි. | එකඟ නොවේ. ගිණුම් ශේෂ වාර්තා කරන 2022.12.31 දිනට ලැබිය යුතු ශේෂය අවසාන විනිමය අනුපාතය පදනම් කර ගිණුම් තබන ලෙස සඳහන් වුවද, ගණුදෙනු කරනු ලබන ආයතන සංඛ්‍යාව හා නිකුත් කරනු ලබන ඉන්වොයිස් ප්‍රමාණය සැලකීමේදී එය ප්‍රායෝගිකව සිදු කළ නොහැක. තවද, නැව් නියෝජිතයන් සමඟ අදාළ ශේෂයන් සම්බන්ධයෙන් එකඟ වී ඇති, Outstanding Balance වෙනස් කිරීම සිදුකළ නොහැක. | ප්‍රමිතය ප්‍රකාරව ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේදී විදේශ මුදලින් වන මූල්‍ය වත්කම් හඳුනාගැනීමේදී වාර්තාකරණ කාලච්ඡේදයේ අවසාන දිනට පැවති “අවසාන විනිමය අනුපාතය” (Closing rate) භාවිතා කර දේශීය මුදලට පරිවර්තනය කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 28 (LKAS 28) හි 17 වන වගන්තිය අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගිණුම්කරණය සඳහා ස්කන්ධ ක්‍රමය අනුගමනය කිරීම අවශ්‍ය නොවන්නේ මව් සමාගම (Parent Company) විසින් සමූහ මූල්‍ය ප්‍රකාශන (Consolidated Financial Statements) පිළියෙළ කිරීමෙන් නිදහස් අවස්ථා වලදී පමණි. එසේ වුවද, අධිකාරියෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.2.2 ට අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගිණුම්කරණය සඳහා ස්කන්ධ ක්‍රමය (Equity Method) යොදා ගන්නා බව සඳහන් කර තිබූ නමුත් අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට සමූහය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණ ද, අධිකාරියේ ආශ්‍රිත සමාගම්වල ආයෝජන පිරිවැයට (Cost Method) හඳුනාගෙන තිබුණි. මේ හේතුවෙන් | එකඟ නොවේ. සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගිණුම්කරණය සඳහා ස්කන්ධ ක්‍රමය (Equity Method) යොදා ගනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 27 (LKAS 27 – Separate Financial Statements) හි 10 වන වගන්තියට අනුව (Para 10) ආශ්‍රිත සමාගම් හි ආයෝජනය (associate) මූල්‍ය ප්‍රකාශන තුළ දැක්වීමේ දී, පිරිවැය ක්‍රමයට (Cost Method) හෝ ගිණුම් ප්‍රමිත අංක 09 (SLFRS) අනුව ස්කන්ධ ක්‍රමයට (Equity Method) ගිණුම් තැබිය හැකිය. ඒ අනුව වරාය අධිකාරිය සමූහයේ ගිණුම්ගත කිරීමට ස්කන්ධ ක්‍රමය ද, වරාය අධිකාරියේ ගිණුම් තුළ | ප්‍රමිතය ප්‍රකාරව ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගිණුම්කරණය සඳහා ස්කන්ධ ක්‍රමය (Equity Method) යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අධිකාරියේ වත්කම් රු. මිලියන 765.6 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආශ්‍රිත සමාගම් ආයෝජනය දැක්වීමට පිරිවැය ක්‍රමය ද යොදාගනු ලබයි. | |
| (ඊ) | 2017 නොවැම්බර් සිට මෙහෙයුම් කටයුතු නතර කර තිබූ අධිකාරියේ පරිපාලිත සමාගමක් වන මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම [MPMC] විසින් 2014 වර්ෂයේදී පුද්ගලික බැංකුවකින් ඇමරිකානු එක්සත් ජනපද (ඇ.එ.ජ) ඩොලර් මිලියන 24 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. එයින් ඇ.එ.ජ ඩොලර් මිලියන 18.82 (රු. මිලියන 6,836) ක් මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබූ අතර ණය පියවීම සඳහා සමාගම සතුව ප්‍රමාණවත් වත්කම් නොමැති බවද නිරීක්ෂණය විය. බැංකුව විසින් මෙම ණය අයකර ගැනීම සඳහා පරිපාලිත සමාගමට හා අධිකාරියට විරුද්ධව නඩු දෙකක් 2020 වර්ෂයේ කොළඹ දිසා අධිකරණයේ පවරා තිබුණ ද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37, 1 (අ) වගන්තිය අනුව ඒ සඳහා අසම්භාව්‍ය බැරකම් වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | එකඟ නොවේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37, 10 (අ) ඡේදය අනුව අසම්භාව්‍ය බැරකම් වෙන් කිරීමක් සිදු කිරීමට අවශ්‍ය කොන්දේසි සියල්ල සම්පූර්ණ නොවන බැවින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කොට නොමැති අතර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 41 හා 43 යටතේ මේ පිළිබඳ හෙළිදරව් කිරීමක් සිදුකොට ඇත. | මූල්‍යමය අවදානම බැහැර කළ නොහැකි නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීම කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 (LKAS 37) හි 85 වගන්තිය අනුව එක් එක් ප්‍රතිපාදනය සඳහා අදාළ බැඳීම් ස්වරූපය පිළිබඳව කෙටි විස්තරයක්, ගෙවීමට සිදුවන කාල වකවානු හා අවිනිශ්චිතභාවයන් පිළිබඳව හෙළිදරව් කළයුතු වුවත් අධිකාරියෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් රු.මිලියන 6,399 ක හිමිකම් පෑ හැකි වෙන්කිරීම් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ නොවේ. 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 55 මඟින් විගණන විමසුමෙන් පෙන්වා දී ඇති වටිනාකම පිළිබඳ සාරාංශයක් ඉදිරිපත් කර ඇති අතර ඊට අමතරව අදාළ වටිනාකමෙහි සවිස්තරාත්මක තොරතුරු උපලේඛණ මඟින් විගණනයට ඉදිරිපත් කර ඇත. ප්‍රතිපාදන වෙන් කර ඇති ගණුදෙනු ප්‍රමාණය විශාල බැවින් එය ගිණුම් තුළම ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව සිදු කළ නොහැක. | ප්‍රමිතය ප්‍රකාරව අදාළ හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | අධිකාරිය විසින් අධිභාර බද්ද ගිණුම් ගත කිරීමේදී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2022 අප්‍රේල් මස නිකුත් කරන ලද 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත ගිණුම් ගත කිරීම පිළිබඳ විකල්ප ප්‍රතිකර්ම ප්‍රකාශය (Statement of Alternative Treatment (SOAT)) අනුව එය මෙම මූල්‍ය වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ නොදක්වා එය 2021 වර්ෂයේදී ගෙවිය යුතු බද්දක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඒ පිළිබඳ අදාළ විකල්ප | එකඟ වේ. 2022 අගෝස්තු 10 වන දින නැවත නිකුත් කරන ලද Addendum SOAT අනුව එම ගැලපුම 2022 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනයෙහි ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයෙහි ආරම්භක රඳවාගත් ලාභයට ගලපා, 2022 වසරෙහි වියදමක් ලෙස ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශයෙහි දක්වන මෙන් සඳහන් කර ඇත. ඒ අනුව අවශ්‍ය අනාවරණයන් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත ගිණුම් ගත කිරීම පිළිබඳ විකල්ප ප්‍රතිකර්ම ප්‍රකාශය Statement of alternative treatments (SOAT) අනුව කටයුතු කළ යුතුය. |

ප්‍රතිකර්ම ප්‍රකාශයේ දක්වා ඇති හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණ සංකල්පනාත්මක රාමුවෙහි (Conceptual framework) 2.6. අනුව මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් හට තීරණ ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන තොරතුරු අදාළ (Relevance) විය යුතු නමුත් පහත අවස්ථාවලදී අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (i) | අධිකාරියේ ආදායම හඳුනාගැනීමේදී රුපියල් වටිනාකමට අමතරව ඇ.එ.ජ ඩොලර් වටිනාකම සටහන් මගින් දක්වා නොතිබීම හේතුවෙන් අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල පහළයාමට සාපේක්ෂ ආදායමෙහි වර්ධනය/ පහළයාම පැහැදිලිව හඳුනාගත නොහැකි වී තිබූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ විදේශ විනිමය ගැලපීම මත සිදුවී ඇති ආදායම් ඉහළයාම පරිශීලකයින්ට වඩා පැහැදිලිව හඳුනාගත නොහැකි වී තිබුණි. | එකග නොවේ. 2022 මූල්‍ය ප්‍රකාශනයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමේ සටහන් අංක 2.3 මගින් ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 21, ඡේද (9) අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී presentation currency ලෙස ශ්‍රී ලංකා රුපියල භාවිත කරන බව අනාවරණය කර ඇත. ඒ අනුව මුදල් ඒකක වර්ග දෙකකින් ගිණුම් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. | අධිකාරියේ ආදායම් සටහන් ලෙස ඇ.එ.ජ. ඩොලර් මගින් දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ලැයිස්තුගත නොකළ කොටස්වල ආයෝජනයෙහි 2022 දෙසැම්බර් 31 දිනට සාධාරණ අගයේ ඉහළ යාම රු. මිලියන 29,974 ක් වූ අතර එම වටිනාකම තුළ වූ හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ සමාගමෙහි (HIPG) ආයෝජිත කොටස්වල සාධාරණ අගය 2021 සිට 2022 වර්ෂය දක්වා රු.මිලියන 143 කින් (ඇ.එ.ජ.ඩොලර් 396,908.82) අඩු වී තිබුණි. නමුත් විදේශ විනිමය අනුපාතය ඉහළයාමේ ප්‍රතිඵලයක් ලෙස HIPG සමාගම ඇතුළු අනෙකුත් ආයෝජිත සමාගම්වල කොටස්හි සාධාරණ අගය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි. අධිකාරිය විසින් සමාගම්වල කොටස් ආයෝජනයන්හි සාධාරණ අගය හඳුනාගැනීමේදී රුපියල් වටිනාකමට අමතරව ඇ.එ.ජ ඩොලර් වටිනාකම සටහනක් ඉදිරිපත් කර නොතිබුණු බැවින් ආයෝජනවල වටිනාකම සමග විදේශ විනිමය ගැලපීම මත සිදුවී ඇති සාධාරණ අගයේ ඉහළයාම මූල්‍ය ප්‍රකාශන මගින් පිළිබිඹු නොවුණි. | එකග නොවේ. 2022 මූල්‍ය ප්‍රකාශනයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමේ සටහන් අංක 2.3 මගින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 21, ඡේද (9) අනුකූලව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී presentation currency ලෙස ශ්‍රී ලංකා රුපියල භාවිත කරන බව අනාවරණය කර ඇත. ඒ අනුව විදේශ විනිමය ගණුදෙනු මත වන බලපෑම ගිණුම් ප්‍රමිත ප්‍රකාරව විදේශ විනිමය ලාභ /පාඩු ලෙස ගිණුම් ගත කර ඇත. ඒ අනුව මුදල් ඒකක වර්ග දෙකකින් ගිණුම් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. | අදාළ පරිදි සටහන් මගින් එම ආයෝජනයන්වල ඇ.එ.ජ. ඩොලර් අගය දැක්වීමට කටයුතු කළ යුතු බව. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිශ්‍ර අංශයේ ඉඩම් රෙජිස්ටරයට අනුව රු. මිලියන 250.8 ක් වටිනා ඉඩම් කැබලි 14 ක් වෙනත් ආයතන වෙත බදු පදනම මත ලබාදී ඇති බව දක්වා තිබූ අතර මූල්‍ය අංශය විසින් පවත්වාගෙන යනු ලබන ආයෝජන දේපල පිළිබඳ ලේඛනයට එම ඉඩම් ඇතුළත්කර නොතිබුණි. මේ හේතුවෙන් අධිකාරියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන දේපල එම වටිනාකමින් ඌනගණනය වී තිබුණු අතර ඉඩම් වටිනාකම අධිගණනය වී තිබුණි. | එකඟ වේ. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමෙන් පසු විමසුමෙහි සඳහන් කර ඇති ආයෝජන දේපළ ඌණගණනය වීම හෝ ඉඩම් අධිගණනය වීම පිළිබඳ ගැටළුව පැන නොනගී. | අධිකාරියේ අනෙකුත් අභ්‍යන්තර අංශ සහ මූල්‍ය අංශය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් යාවත්කාලීන තොරතුරු මත මූල්‍ය ප්‍රකාශ සකස් කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ සමාගමේ (HIPG) (ලැයිස්තුගත නොකළ) කොටස්වල 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 59,577 ක් වූ සාධාරණ අගය 2021 වර්ෂයේ සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගණනය කිරීම් සිදුකර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත ගණනය නොකිරීම හේතුවෙන් HIPG හි ආයෝජන වටිනාකම රු. මිලියන 212 කින් අධිගණනය වී තිබුණි. | එකඟ නොවේ. HIPG සමාගමේ විගණිත ගිණුම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබී ඇත්තේ 2023 මැයි 11 වන දිනය. ඒ අනුව ගිණුම්වල සිදුවිය යුතු ගැලපුම් 2023 වසරේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | කොටස්වල සාධාරණ අගය විගණිත මූල්‍ය ප්‍රකාශන මත තීරණය කිරීම වඩා නිවැරදි වන බැවින් එම අගය මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. |
| (ඇ) | විදේශ මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 1,531 ක් වූ ශේෂය තුළ, භාණ්ඩ ලැබී ගෙවීම් අවසන් කර තිබූ නමුත් වියදම් ලෙස ආදායම් ප්‍රකාශයට හඳුනාගැනීමට හෝ හඳුනාගත් ප්‍රතිපත්තියක් මත වත්කම් ප්‍රාග්ධනීත කිරීමට කටයුතු නොකළ රු. මිලියන 1,071 ක් වූ අමතර කොටස් සහ වත්කම් මිලදී ගැනීම් පැවතුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය/ ජංගම නොවන වත්කම් එම වටිනාකමින් අධිගණනය/ ඌනගණනය වී තිබුණි. | එකඟ වේ. විදේශ මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමේ පවතින රු.මි. 1071 ක ශේෂයෙන් 2023 වසරේදී රු.මි. 59 ක් නිරවුල් කර ඇති අතර ඉතිරි ශේෂය නිරවුල් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. | විදේශ මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමේ ඉතිරි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලැබිය යුතු බිම් කුලී ආදායම් | | |
| (i) | නිෂ්කාශනය කර නොගත් ආනයන බහාලුම් 244 ක් දින 22 සිට දින 3583 දක්වා කාලයක් වරාය අංගනයේ පැවති අතර එම බහාලුම් සඳහා 2022 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතුව පැවති රු. මිලියන 3,952 ක බිම් කුලී මූල්‍ය ප්‍රකාශන තුළ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | එකඟ වේ. මින් කොටසක් මේ වන විට ප්‍රේෂණලාභීන් විසින් නිදහස් කර ගෙන ගොස් ඊට අදාළ ගාස්තු අධිකාරිය විසින් අය කර ගෙන ඇත. ඉතිරි බහළුම් ප්‍රේෂණලාභීන් විසින් නිෂ්කාශණය කර නොගත් ඒවා හා රේගුව මගින් පරීක්ෂණ සඳහා රඳවාගෙන ඇති භාණ්ඩ වේ. ආනයනය | අදාළ බිම් කුලිය ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සීමා කර ඇති භාණ්ඩ නිදහස් කිරීමට හෝ ටෙන්ඩර් සඳහා ලැයිස්තු ගත කිරීමට ආනයන හා අපනයන පාලක අනුමැතිය ලබා නොදෙන බැවින් එහි බිම් කුලිය ආදායමක් ලෙස දැක්වීම ප්‍රායෝගික නොවේ. | |
| (ii) | නිෂ්කාශනය කර නොගත් ආනයනික වාහන 50 ක් දින 810 සිට දින 5203 දක්වා කාලයක් වරාය අංගනයේ පැවති අතර එම බහාලුම් සඳහා 2022 දෙසැම්බර් 31 දක්වා අයවිය යුතුව පැවති රු. මිලියන 1,949 ක බිම් කුලී මූල්‍ය ප්‍රකාශන තුළ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | මෙහි සඳහන් වාහන 50 න් 42 ක් රේගුව මගින් පරීක්‍ෂණය සඳහා රඳවා ගෙන ඇති අතර රේගුව විසින් රේගු භාරයට ගතහොත් වරායට බිම් කුලිය නොගෙවන බැවින් එම වාහන රේගුව විසින් නිදහස් කරන තෙක් ආදායමක් ලෙස පෙන්වීම ප්‍රායෝගික නොවේ. ඉතිරි වාහන 08 ආනයන සීමා පනවා ඇති කාලසීමාව තුළ මෙරටට ගෙන්වා ඇති බැවින් ආනයන හා අපනයන පාලක අනුමැතිය ලැබෙන තෙක් වරායට නිදහස් කළ නොහැක. | අදාළ බිම් කුලී ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | විලම්බිත බදු වගකීම ගණනයේදී අධිකාරිය බදු සහන ලබාගත් තව දුරටත් භාවිතා කරන වත්කම්වල වටිනාකම වන රු.මිලියන 9,787 ක් සැලකිල්ලට නොගැනීම සහ රු.මිලියන 1,516 ක් වූ අස්පෘශ්‍ය වත්කම් නිශ්කාෂණ ගිණුමේ වටිනාකම දෙවරක් සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් අධිකාරියේ විලම්බිත බදු වගකීම රු. මිලියන 996 කින් අඩුවෙන් දක්වා තිබූ අතර එම ප්‍රමාණයෙන් ලාභය අධිගණනය වී තිබුණි. | එකඟ නොවේ. බදු සහන ලබාගත් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම්වල වටිනාකම වන රු. මි.9,787 ගිණුම්කරණ පොත් අගයට ගැලපීම කළ යුතු වුවත් වැරදීමකින් එම අගය රු.මි.11,963 ක් ලෙස ගිණුම්කරණ පොත් අගයට ගලපා ඇති අතර එය නිවැරදි කිරීමෙන් පසු විලම්බිත බදු අගය අඩුවෙන් දක්වා ඇත්තේ රු.මි. 996 කින් පමණි. | අදාළ විලම්බිත බදු ගණනය කිරීම් නිවැරදිව කර අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඊ) | අධිකාරියේ ආදායම් බදු ගණනයේදී මූල්‍ය ප්‍රකාශන අනුව බදු පෙර ලාභය වූ රු. මිලියන 57,025.7 වෙනුවට රු. මිලියන 58,025.7 ක් සාවද්‍ය ලෙස බදු පෙර ලාභය ලෙස යොදා ගැනීම නිසා බදු වගකීම රු.මිලියන 123 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ නොවේ.ආදායම් බදු ගණනයේ දී අප විසින් බදු පෙර ලාභය ලෙස රු.58,025,790,184 ගැනීම නිවැරදි නොවන අනුව බදු පෙර ලාභය ලෙස නිවැරදිව රු.57,025,790,184 ගැලපුම් කිරීමෙන් පසු බදු වගකීම රු.123,137,909 කින් පමණ අඩු වේ. | ආදායම් බදු ගණනය කිරීම් නිවැරදිව සිදුකර අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකළ යුතුය. |
| (උ) | අධිකාරියේ විදේශ විනිමයෙන් ලැබෙන ආදායම් දේශීය මුදලට පරිවර්තනයේදී ගැනුම් මිල අනුපාතය (Buying Rate) වෙනුවට වැඩි වටිනාකමක් සහිත විකුණුම් මිල (Selling Rate) යොදාගත් පහත අවස්ථා නිරීක්ෂණය විය. | | |
| (i) | කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්ත සමාගමේ (C.I.C.T) බහාලුම් මෙහෙයුම් ප්‍රමාණය මත එනම් එකඟවූ අවම විසිසම බහාලුම් සංඛ්‍යාව (Twenty Equivalent Units) | එකඟ නොවේ. “රාජ්‍ය භාග” අය කිරීම සඳහා බිල්පත් කිරීමේ දී ගිවිසුම් ප්‍රකාරව එය ඇමරිකානු ඩොලර් මුදල් ඒකකයෙන් සිදු කරනු ලැබේ. එය | අදාළ රාජ්‍ය භාග ආදායම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී විදේශ විනිමය ගැණුම් |

| | | | |
|---|---|---|---|
| | හා ඊට අමතරව මෙහෙයවනු ලබන බහාලුම් සංඛ්‍යාව මත ලැබෙන "රාජ්‍ය භාග" (Royalty) ආදායම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී විකුණුම් මිල භාවිතා කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වෙනත් ලැබිය යුතු දැ හි වටිනාකම රු. මිලියන 69.5 කින් අධිතක්සේරුවී තිබුණි. | ගිණුම් තුළට ගැනීම සඳහා විකුණුම් අනුපාතය යොදා ගැනීම ආරම්භයේ සිටම සිදු වන අතර නැවත මුදල් ලැබීමේ දී ඇති වන විදේශ විනිමය ලාභය/පාඩුව ගිණුම් තුළ ගැලපීමක් සිදුවේ. එමනිසා ආදායම අධිතක්සේරු වීමක් සිදු වී නොමැත. | මිලට භාවිතා කළ යුතුය. |
| (ii) | අධිකාරිය වෙත දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම (S.A.G.T) විසින් ගෙවනු ලබන රාජ්‍ය භාග (Royalty) ආදායම හා බදු කුලී (Lease Rent) ආදායමෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වටිනාකම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී විකුණුම් මිල අනුපාතය යොදාගැනීම හේතුවෙන් එකී ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු. මිලියන 5.2 න් හා රු. මිලියන 2.9 කින් අධිතක්සේරුවී තිබුණි. | "රාජ්‍ය භාග" අය කිරීම සඳහා බිල්පත් කිරීමේ දී ගිවිසුම් ප්‍රකාරව එය ඇමරිකානු ඩොලර් මුදල් ඒකකයෙන් සිදු කරනු ලැබේ. එය ගිණුම් තුළට ගැනීම සඳහා විකුණුම් අනුපාතය යොදා ගැනීම ආරම්භයේ සිටම සිදු වන අතර නැවත මුදල් ලැබීමේ දී ඇති වන විදේශ විනිමය ලාභය/පාඩුව ගිණුම් තුළ ගැලපීමක් සිදුවේ. එමනිසා ආදායම අධිතක්සේරු වීමක් සිදු වී නොමැත. | අදාළ රාජ්‍ය භාග ආදායම දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී විදේශ විනිමය ගැණුම් මිලට භාවිතා කළ යුතුය. |
| (ඇ) | ගාල්ල වරායේ බහුකාර්ය පර්යන්තයක් ඉදිකිරීම සඳහා 2006 මාර්තු 28 දින ශ්‍රී ලංකා රජය හා අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපාන බැංකුව (JBIC) අතර ණය ගිවිසුමකට එළඹ තිබුණු අතර ගාලු කොටුව ආශ්‍රිතව මෙම ඉදිකිරීම් සිදු කිරීම සඳහා යුනෙස්කෝ (UNESCO) අනුමැතිය ලබාගත යුතුව තිබුණි. ඒ සඳහා වසර 3 කට අධික කාලයක් ගතවීමත්, ණය අරමුදල් ප්‍රමාණවත් නොවීමත්, ණය කාලසීමාව දීර්ඝ නොකිරීමත් යන හේතු මත මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. මේ සඳහා වැය කරන ලද රු.මිලියන 422.5 ක් වූ උපදේශන ගාස්තු අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ කෙරීගෙනයන වැඩ යටතේ දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම වියදම ප්‍රාග්ධන හෝ අයභාර වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඉහත වැය කරන ලද මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | එකඟ නොවේ. ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන අවස්ථාවේ මෙම ව්‍යාපෘතියේ නිර්මාණ සැළසුම් භාවිතා කළ හැකි නිසා මෙම වියදම අනාර්ථික වියදමක් නොවේ. තවද 2022 වර්ෂයේ ආරම්භ කළ ගාලු වරාය සඳහා ව්‍යාපෘති අභිලාෂයන් කැඳවීම මෙම සැළසුම් මත පදනම්ව සිදු කෙරිණි. එබැවින් ගාලු වරාය ව්‍යාපෘතිය සඳහා පිළියෙල කළ සැලසුම එම ව්‍යාපෘති අභිලාෂයන් කැඳවා ගාලු වරායේ සංවර්ධන ව්‍යාපෘතියට අනුගත වන බැවින් වාර්තාවේ සඳහන් පරිදි මෙය අනාර්ථික වියදමක් නොවේ. මේ පිළිබඳ ගිණුම් අංක 51 මඟින් අනාවරණය කර ඇත. | වියදමේ ස්වභාවය, අනාගත අපේක්ෂාවන් ආදිය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව තාර්කිකව වියදම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ක්ෂේත්‍ර රාජකාරී වෙනුවෙන් හා ඉඩම් එළිපෙහෙලි කිරීමට අදාළව 2014 වර්ෂයේදී රු.මිලියන 4.39 මුදලක් ද, ඉඩම් අහිමිවූවන්ට වන්දි ගෙවීම සඳහා 2015 සහ 2016 වර්ෂයන්හිදී රු.මිලියන 108.77 ක මුදලක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ද වැයකර තිබුණි. 2021 | එකඟ වේ. ඉඩම් අයිතිය තවමත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පවරා නොමැත. අත්පත්කරගත් ඉඩම් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැවරීම සඳහා හිටපු ජනාධිපති වරයාගේ අනුමැතිය හිමිවී ඇත. ඔප්පු ලේඛන පිළියෙල කර අත්සන් ලබා ගැනීම | නීත්‍යානුකූලව ඉඩම් පවරා ගැනීමත් සමඟ පවරා ගන්නා ලද ඉඩම්වල වටිනාකම් ඉඩම් නිෂ්කාශන ගිණුමෙන් ආයෝජන දේපළ ගිණුමට මාරු |

| | | | |
|---|---|---|---|
| | අප්‍රේල් 30 දින වන විට අදාළ වන්දි ගෙවීම් පිළිබඳ වාර්තාව අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් වැය කරන ලද රු.මිලියන 113.16 ක මුදල ආයෝජන දේපල ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සඳහා ඒවා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර දෝෂ කිහිපයක් තිබීම හේතු කොට ගෙන ඇතැම් ලේඛන ඉඩම් කොමසාරිස් ජනරාල් වරයා වෙත ආපසු එවා ඇත. මෙම ලේඛන නිවැරදි කර ඔප්පු පිළියෙල කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලය කටයුතු කරමින් සිටී. මෙම ඉඩම් අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැවරීමෙන් පසු මෙම වත්කම් අධිකාරියේ පොත්වලට ඇතුළත් කළ හැක. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2001 වර්ෂයේදි දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (S.A.G.T) සමාගම ආරම්භ කරන අවස්ථාවේදී අධිකාරිය විසින් ලබාදුන් දොඹකර තුනක අගය හුවමාරු කරගැනීම සඳහා රු.මිලියන 141.63 ක වටිනාකමට එම සමාගමෙහි කොටස් අධිකාරිය වෙත ලබාදෙන බවට එකඟ වී තිබුණු බව මූල්‍ය ප්‍රකාශනවල 12.2 සටහනේ දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ලැබිය යුතු දෑ යටතේ දක්වා තිබූ මෙම මුදල හෝ කොටස්වල හිමිකම සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් අධිකාරිය වෙත ලබා දී නොතිබූ අතර අදාළ සමාගම විසින් කොටස් සඳහා ගෙවිය යුතු මුදලක් නොමැති බවට ශේෂ සනාථ මගින් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් දකුණු ආසියා පිවිසුම් පර්යන්ත සමාගම සමග ගිවිසුම්ගත බැඳීමක් ඇති කරගෙන නොතිබිම හේතුවෙන් අධිකාරිය වෙත අදාළ සමාගමේ කොටස් ලැබිම අවිනිශ්චිත තත්ත්වයක පැවති අතර ,අධිකාරිය ඉහත ලැබිය යුතු කොටස් වටිනාකම සඳහා හානිකරණ වෙන්කිරිමක් ද සිදුකර නොතිබුණි. | ''දකුණු ආසියා පිවිසුම් පර්යන්තය සමග ගිවිසුමාත්මක බැඳීමක් ඇතිකර ගෙන නොතිබීම'' යන ප්‍රකාශය සිද්ධිය පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව ඉදිරිපත් කොට ඇති බව නිරීක්ෂණය වේ. වරාය අධිකාරියට ලැබිය යුතු කොටස් හිමිකම ලබාගැනීම සඳහා දිගින් දිගටම ලිපි මඟින් S.A.G.T සමාගමෙන් ඉල්ලීම් කර ඇත. | අදාළ සමාගම සමග සාකච්ඡා කර ගිවිසුම පරිදි දොඹකරවල වටිනාකම සඳහා අධිකාරියට ලැබිය යුතු හිමිකම ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2007/08 සිට 2010/11 වර්ෂ දක්වා වූ මූල්‍ය වර්ෂයන් සඳහා අධිකාරියේ ආදායම් බදු ගණනය කිරීම සම්බන්ධයෙන් අභියාචනයක් බදු අභියාචනාධිකරණයට ඉදිරිපත් වී තිබූ අතර තීන්දුවක් ලබා දී නොතිබූ බැවින් අදාළ වර්ෂ සඳහා බදු ගෙවා නොතිබුණි. කෙසේ වුවද, මේ සඳහා රු.මිලියන 6,387.35 ක් වූ වෙන් කිරිමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළයුතු වුවද, රු.මිලියන 1,141.75 ක් අඩුවෙන් එනම් රු.මිලියන 5,245.6 ක වෙන්කිරිමක් පමණක් සිදු කර තිබුණි. | එකඟ නොවේ. 2009/2010 බදු වර්ෂයට අදාළව අභියාචනාධිකරණය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පක්ෂව තීන්දුවක් ලබා දී ඇති බැවින් 2020 වර්ෂයේ සිටම ගිණුම් තුළ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොකරන ලදී. අභියාචනාධිකරණයේ පවතින අනෙකුත් නඩු සඳහා රු.මි. 5,245.6 ප්‍රතිපාදන ගිණුම් තුළ වෙන් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ වෙන්කිරීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ලෙස දක්වා තිබූ රඳවාගැනීමේ බදු ශේෂය රු. මිලියන 581.31 ක් හා ලැබිය යුතු ආදායම් බදු ශේෂය ලෙස රු. මිලියන 2,102 ක ශේෂයක්, ගෙවිය යුතු බදු වගකීමට එරෙහිව හිලව් කළ යුතු වුවද, අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ නොවේ. එම මුදල ගෙවිය යුතු ආදායම් බද්දට හිලව් කරන තුරු ලැබිය යුතු ආදායම් බදු ලෙස ගිණුම්ගත කර පෙන්වයි. | අදාළ ලැබිය යුතු රඳවාගැනීමේ බදු යනාදිය ඉක්මණින් හිලව්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. මි | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. මි | වෙනස රු. මි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා රාජ්‍ය බැංකුවකින් ලබාගත් ණය | 3,292.38 | 3,355.17 | 62.79 | මෙම ශේෂ අතර වෙනසට හේතුව සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් මහජන බැංකුව සමග සාකච්ඡා කර අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී. | අදාළ වෙනසට හේතු සොයා බලා එම වෙනස්කම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | වත්කම් කාණ්ඩ 08 කට අදාළ ස්ථාවර වත්කම් එකතු කිරීම් (Additions) | 316 | 866.2 | 550.2 | එකඟ නොවේ. 2023 මාර්තු 16 දිනැති අංක FD/FA/C/82/2023/12 දරන ලිපිය මගින් ඉදිරිපත් කර ඇති වත්කම් එකතුකිරීම් (Additions) හා මූල්‍ය ප්‍රකාශනවල වත්කම් එකතු කිරීම් (Additions) අතර වෙනසක් නොමැත.. | අදාළ වෙනසට හේතු සොයා බලා එම වෙනස්කම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ගිණුම් අංක 27 දරන ණයගැතියාගෙන් අයවිය යුතු බිම් කුලිය | 13.75 | 40.37 | 26.62 | ගිණුම් අංක 27 දරණ පෞද්ගලික ආයතනයෙන් අයවිය යුතු මුදල රු. 40,372,508 නිවැරදි වේ. | අදාළ වෙනසට හේතු සොයා බලා එම වෙනස්කම් නිවැරදි කළ යුතුය. |

### 1.5.5. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු.මි | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල වෙනුවෙන් වාරිකයක් ලෙස අධිකාරිය විසින් 2017 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 4,406 ක් හා මුද්දර ගාස්තු රු. මිලියන 372 ක් ද ඇතුළුව 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4,778 ක මුදල. | 4,778 | ශේෂ සනාථ | එකඟ නොවේ. අදාළ මුදල ආපසු වරාය අධිකාරියට ලබා දෙන ලෙස මහා භාණ්ඩාගාරයේ ලේකම් වෙත ලිපි යවා ඇති අතර 2019.02.12 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් ද මේ පිළිබඳව දැනුම් දී ඇත. මේ සඳහා සාකච්ඡාවක් ලබා දෙන ලෙස ඉල්ලා වරාය නාවික සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් මහා භාණ්ඩාරයේ ලේකම් වෙත ලිපි යවා ඇති අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ද ඉහත මුදල් ලබාදෙන ලෙස ඉල්ලා ලිපි යවා ඇත. | මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡාකර ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෙල් ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරය විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබූ ඩොලර් ණය මුදල් මහා භාණ්ඩාගාරය විසින් නියමිත වේලාවට නොගෙවීම හේතුවෙන් 2018 වර්ෂයේදී එම රාජ්‍ය බැංකුවේ අධිකාරිය නමින් පවත්වාගෙන යන ඇ.එ.ජ ඩොලර් ගිණුමෙන් බැංකුව විසින් අයකරගෙන තිබූ ඇ.එ.ජ ඩොලර් 635,069, එනම් රු. මිලියන 377.8 ක මුදල. | 377.8 | ශේෂ සනාථ | එකඟ නොවේ. මෙය නිවැරදි කර අදාළ අයකරගත් මුදල නැවත ලබාදෙන ලෙස ඉල්ලීම් කරමින් පෙර වර්ෂවල සේම 2021 වර්ෂයේදී ද 2021.03.31, 2021.06.15, 2021.12.02 සහ 2022.06.20, 2023.03.24 දිනයන්හි ලංකා බැංකුවෙහි ප්‍රධාන ශාඛාව වෙත ලිපි යවා ඇත. එම මුදල නැවත ලබා ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් හැකි සෑම ප්‍රයත්නයක්ම දරමින් සිටී. | මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡාකර ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලංකා කෝල් සමාගමෙහි (Lanka Coal Company) කොටස්වල ආයෝජනය | 10.7 | අදාල සමාගමෙහි 2022 මූල්‍ය ප්‍රකාශන | එකඟ නොවේ. අප විසින් කිහිප වරක්ම 2022 දෙසැම්බර් 31 සඳහා මූල්‍ය ප්‍රකාශන අප වෙත ලබාදෙන ලෙස ලංකා කෝල් සමාගමෙන් | ලංකා කෝල් සමාගමෙහි නව මූල්‍ය ප්‍රකාශන |

| | | |
|---|---|---|
| | (Lanka Coal Company) ඉල්ලුම් කළ ද, මේ වන තෙක් මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත. ඒ අනුව 2021 සිට 2022 දක්වා ලංකා කෝල් සමාගමේ ආයෝජන වටිනාකම නොවෙනස්ව පවතින බව අනාවරණය කර ඇත. | ලබාගෙන එහි වටිනාකම් සලකා බැලිය යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ණය කාලසීමාව ඉක්මවූ මුළු නැව් නියෝජිත ණයගැති ශේෂය රු.මිලියන 4,795 ක් වූ අතර එය මුළු නැව් නියෝජිත ණයගැති ශේෂයෙන් සියයට 64 ක් විය. එය තුළ වූ රු.මිලියන 2,798 ක් ව පැවති කොළඹ වරායේ ණය කාලසීමාව ඉක්මවූ ශේෂය විගණිත දින වන විට ද නිරවුල් කර නොතිබුණි. | 2022.12.31 දිනට ණයකාලසීමාව ඉක්ම වූ ණයගැති ශේෂය සමඟ එකඟ වේ.<br>ඉහත නැව් නියෝජිත ආයතන වලින් අය විය යුතු රු 6,035,370.99 ක මුදල් ලියා ඉවත් කිරීමට නිර්දේශ ලබා ගැනීම සඳහා 2023.05.11 දින විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. | අනුමත ණය කාල සීමාව තුළ අදාළ ණය ශේෂයන් අය කර ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීමට කළමණාකරණය විසින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ආරවුල් සහිත ණයගැති ශේෂය (dispute debtors) රු.මිලියන 229 ක් සහ නැවත විසඳීම සඳහා (re-dispute) යොමු කළ ණයගැති ශේෂය රු.මිලියන 10.8 ක් නිරවුල් නොකර පැවතුණි. | ආරවුල් සහිත ණයගැති ශේෂයන් සමඟ එකඟ වේ. 2023.05.15 දින වන විට කොළඹ වරායේ dispute ගිණුමෙහි ශේෂය රු.113,772,450 දක්වාත් Re-dispute ශේෂය රු.5,613,084 දක්වාත් අඩු වී ඇත. රු.107,909,678 ක් වූ පෞද්ගලික ආයතනයක dispute බිල්පත්, සේවා ගාස්තු සංශෝධනය පර්යන්ත සේවා ගිවිසුමට පටහැනි බව පවසා යොමුකළ බිල්පත් වන අතර විසඳීම සඳහා අවශ්‍ය කටයුතු සාකච්ඡා මට්ටමේ පවතී. එහිදී ගනු ලබන තීරණය අනුව විසඳීමට කටයුතු කරනු ලැබේ. | පවත්නා ගැටළු නිරාකරණය කරගෙන ලැබිය යුතු දැ හැකි ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ සම්බන්ධයෙන් නඩු කටයුතු ආරම්භ කර ඇති (Under Litigation) නැව් නියෝජිත ණයගැති වටිනාකම රු. මිලියන 491.6 ක් වූ අතර එයින් කොළඹ වරායට අදාළ රු.මිලියන 428.8 ක ශේෂය සඳහා ණයගැතියන් 12 දෙනෙකු (Marshal of Admiralty High Court ඇතුළුව) මූල්‍ය කොට්ඨාශය මගින් දක්වා තිබුණ ද එම වටිනාකම තුළ වූ රු. මිලියන 20.2 ක ණයගැතියන් 4 දෙනෙකු සම්බන්ධයෙන් නඩු පවරා ඇති බවට නීති කොට්ඨාශය | ණයගැති වටිනාකම සමඟ එකඟ වේ. ගිණුම් අංක 278 හා 303 නැව් නියෝජිතයින්ගේ ශේෂ පොත්වලින් ලියා හැරීම සඳහා AR (Account Receivable Committee) කමිටුවේ දී තීරණය කර ඒ අනුව රු. 6,035,370.99 ක මුදල් ලියා ඉවත් කිරීමට නිර්දේශ ලබා ගැනීම සඳහා 2023.05.11 දින විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. පෞද්ගලික ආයතනයේ Diamand Discovery නෞකාව වෙනුවෙන් අයවිය යුතු ගාස්තු සඳහා සහතික කරන ලද පිටපත් නීති කොට්ඨාශය වෙත යොමු කර ඇත. තවත් | දීර්ඝකාලීනව මුදල් නොගෙවා ඇති ණයගැතියන් සම්බන්ධයෙන් නඩු පැවරීමට ඇති හැකියාව නීති කොට්ඨාශය විසින් තක්සේරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මගින් විගණනය වෙත දන්වා නොතිබුණි. | ආයතනයක් සම්බන්ධයෙන් ද නීති උපදෙස් සඳහා යොමු කර ඇත. | |
| (ඇ) | අධිකාරිය විසින් දීර්ඝ කාලීනව මුදල් අයකරගෙන නොතිබූ රු. මිලියන 40.3 ක වටිනාකමකින් යුත් පරිශ්‍ර කුලී ණයගැතියෙකු හා රු. මිලියන 3.5 ක වටිනාකමින් යුත් නැව් නියෝජිත ණයගැතියන් දෙදෙනෙකු සම්බන්ධයෙන් පවරන ලද නඩු කටයුතුවල නියෝග අධිකාරියට පක්ෂව තීන්දු කර ඇති බව නීති කොට්ඨාශය විසින් විගණනය වෙත දන්වා තිබුණි. කෙසේ වුවද, නියෝග දිනයේ සිට දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද එම තීන්දු ක්‍රියාත්මක කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෞද්ගලික ආයතනයකින් අය විය යුතු රු. 1,727,587 ක මුදල අය කර ගැනීම සඳහා එම ආයතනය සතු වත්කම්හි විස්තර ලබා දෙන ලෙස අධිකරණය විසින් අප වෙත දන්වා සිටින ලද අතර එම ආයතන සතු වත්කම් සොයා බැලීම සඳහා එම සේවාව සැපයීමට අදාළ වෙනත් ආයතනයක සහාය ලබා ගැනීමට පියවර ගෙන ඇත.<br>Ocean Lanka Services (Pvt) Ltd නඩුව කොළඹ දිසා අධිකරණයේ 2019.05.13 වන දින අධිකාරියට පක්‍ෂව නියෝගය ලබා දෙන ලදී. ඒ අනුව ඇස්තීසි ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් සිටී.<br>Consolidated marine engineering Ltd නඩුවේ ඒකපාර්ශ්වික නියෝගය 2015.11.12 දින ලබා දුන් අතර අධිකාරිය විසින් තීන්දු ප්‍රකාශයක් 2016.01.21 දින අධිකරණයේ ගොනු කරන ලදී.ගොනු කර ඇති තීන්දු ප්‍රකාශය අනුව අය විය යුතු ගාස්තු ගණනය කිරීම සිදු කළ අතර එහි නිරවද්‍යතාවය අධිකරණය විසින් ලබා දුන් පසු එම ආයතනය සතු වත්කම් සොයා බලා අධිකරණය වෙත දැන්වීමෙන් පසුව තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කළ යුතු වේ. | ණයගැති තොරතුරු ඇතුළත් නොවීම පිළිබඳ සොයාබැලිය යුතු අතර ණයගැති ශේෂයන් අතර පවතින වෙනස්කම්වලට හේතු දක්වමින් ණයගැති සැසඳුම් ප්‍රකාශනයක් සකස් කළ යුතුය. |
| (ඉ) | අධිකාරිය විසින් MV Jammi නෞකාව සඳහා ලබාදෙන ලද සේවා සඳහා අයවිය යුතු මුදල් වෙනුවෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් ගොනු කර තිබූ අතර 2009 මාර්තු 13 වන දින ලද තීන්දුව අනුව රු. මිලියන 197.1 (ඇ.එ.ජ ඩොලර් 1,945,712) ක මුදලක් අදාළ යාත්‍රාවෙන් අධිකාරිය වෙත ලැබිය යුතුව තිබුණි. අදාළ නෞකාව වෙන්දේසියෙන් ලද මුදල අධිකරණයේ තැන්පත් කර තිබුණු බවත් එම මුදල් සඳහා හිමිකම් සහිත විවිධ පාර්ශවයන් වෙත අදාළ මුදල් ප්‍රමාණයන් මුදාහැරීමෙන් පසුව ඉතිරි වූ මුදල වන ඇ.එ.ජ ඩොලර් 692,080 ක මුදල සම සමව බෙදා ගැනීමට පෙත්සම්කාර රාජ්‍ය සමාගම හා අධිකාරිය 2017 පෙබරවාරි 23 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව එකඟතාවයකට පැමිණ තිබුණ ද, | MV Jammi නෞකාව සඳහා ලබාදෙන ලද සේවා සඳහා අයවිය යුතු මුදල රු.197,093,842 සමඟ එකඟ වේ. | අදාළ ආයතන සමග තවදුරටත් සාකච්ඡාකර අධිකාරිය වෙත ලැබිය යුතු මුදල හැකි ඉක්මණින් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවදුරටත් මුළු මුදලම ලැබිය යුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | | |
| (ඊ) | 2022 නොවැම්බර් 21 දිනැති අංක මුකො/මුගි/කො/41/2022 දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 6.5 වගන්තිය ප්‍රකාරව බදු දී ඇති පරිශ්‍ර වෙනුවෙන් ලැබිය යුතු බදු මුදල් සහ විදුලි බිල් ප්‍රතිපූර්ණයන් නියමිත කාලය තුළ අප්‍රමාදව එකතුකර ගැනීමට ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට මාස 6 ඉක්මවූ පරිශ්‍ර කුලී ණයගැතියන් රු.මිලියන 172.9 ක් වූ අතර එය මුළු පරිශ්‍ර කුලී ණයගැතියන්ගෙන් සියයට 76 ක් පමණ විය. 2023 මැයි 24 දින වන විටත් ඉන් රු. මිලියන 1.1 ක් පමණක් නිරවුල් වී තිබූ අතර රු. මිලියන 5.6 ක මුදලක් ලියාහැරීමට අධිකාරිය කටයුතු කර තිබුණි. | ණයගැති ශේෂය සමඟ එකඟ වේ. කොළඹ වරායට අදාළ පරිශ්‍ර කුලී ණයගැති ශේෂය 2023.05.24 වන විට රු. 1,062,272.59 ක ශේෂයක් නිරවුල් කර ඇත. Team Work ආයතනයට අදාළ රු.5,614,262 ක අයවිය යුතු මුදල 2023.01.30 දින ලද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව 2023 පෙබරවාරි මස ලියාහරින ලද අතර මාස 06 ඉක්ම වූ රු.77,032,359 ක ශේෂය ලියා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. බදු දී ඇති පරිශ්‍ර වෙනුවෙන් ලැබිය යුතු මුදල් අය කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරගෙන යනු ලැබේ. | අදාළ ආයතන සමග තවදුරටත් සාකච්ඡාකර අධිකාරිය වෙත ලැබිය යුතු මුදල හැකි ඉක්මණින් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | Barge Formentera යාත්‍රාවට අදාළව පැවති නඩු කටයුත්තේ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අදාළ යාත්‍රාවට සපයන ලද සේවාවන් සඳහා රු. මිලියන 81.6 ක මුදලක් ලැබිය යුතු බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අධිකරණය වෙත දන්වා සිටි බවත් එම වටිනාකම නැවත ගණනය කිරීම්වලින් පසු 2023 මාර්තු 09 දින අධිකරණය විසින් රු. මිලියන 69.1 ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත මුදා හැරීමට නියෝග කරන ලද බවත් ප්‍රධාන නීති නිලධාරි දන්වා තිබුණි. කෙසේ වුවද, අදාළ නැව් නියෝජිත ණයගැතියාගෙන් අයවිය යුතු ශේෂය රු. මිලියන 34.3 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | මෙහි අධිකරණ ගිණුමෙන් මුදල් නිකුත් කිරීමේදී අදාළ මුදල් අධිකරණයේ රෙජිස්ටාර්වරයා විසින් අත්සන් කරනු ලබන චෙක්පතකින් නිකුත් කරනු ලබන බැවින් උපකල්පනය කර ඇති පරිදි මුදල් වංචා සිදු වීමට හැකියාවක් නොමැත. | අදාළ වෙනසට හේතු සොයා බලා අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඌ) | ප්‍රධාන නැව් නියෝජිත ආයතනයක් වූ ගිණුම් අංක 393 දරන නැව් නියෝජිත ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට ආරවුල් සහිත ණයගැති (Dispute Debtors) ශේෂය බිල්පත් 1,292 කින් සමන්විත රු. මිලියන 128.3 ක් වූ අතර "ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2022 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ගාස්තු සංශෝධනය, අදාළ නැව් නියෝජිතයාගේ පර්යන්ත සේවා | ගිණුම් අංක 393 Evergreen Shipping Agency Lanka (Pvt) Ltd ආයතනයේ රු. 128,304,375 ශේෂය නොවිසඳුණු බිල්පත් විසඳීමේ කමිටුවට හැකියාවක් නොමැති බැවින් වරාය අධිකාරිය විසින් තීරණයක් ගත යුතුව ඇත. ඒ අනුව අදාල ආයතන සමග සාකච්ඡා කර වරාය අධිකාරිය විසින් මේ පිළිබඳව තීරණයක් ගනු ලැබේ. | අදාළ විවාදිත බිලපත් ඉක්මණින් නිරවුල් කරගත යුතු අතර ගාස්තු සංශෝධනයේදී වරායවල් පනතට අනුව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුමට පටහැනිවීම" හේතුවෙන් අදාළ නැව් නියෝජිත ආයතනය විසින් එම බිල්පත් ආරවුල් විසඳීම සඳහා ඉදිරිපත් කර තිබුණි. ප්‍රධාන ගනුදෙනුකාර ආයතන සමග පවත්නා විවාදිත බිල්පත් හැකි ඉක්මණින් නිරවුල් කරගැනීමට හා අධිකාරියේ ගාස්තු සංශෝධනයේදී 1979 අංක 51 දරන වරායවල් පිළිබඳ අධිකාරිය පනතෙහි 37 (1) වගන්තිය ප්‍රකාරව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | |
| (එ) | 2022 නොවැම්බර් 21 දිනැති අංක මුකො/මුගි/කො/41/2022 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 2.4, 2.5, 2.7 හා 2.10 වගන්ති ප්‍රකාරව තෙවන පාර්ශවයන් වෙත ශේෂ සනාථ යැවීමේදී අදාල ලිපිනයන් නිවැරදි දැයි තහවුරු කර ගැනීම අත්‍යාවශ්‍ය වුවද 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ තහවුරු කරගැනීම සඳහා යැවූ රු. මිලියන 651.3 ක වටිනාකමින් යුත් ණයහිමියන් 25 ක හා රු.මිලියන 3,839.4 ක වටිනාකමින් යුත් ණයගැතියන් 9 ක ශේෂ සනාථ නිවැරදි ලිපිනයන් නොමැතිවීම හේතුවෙන් නැවත හරවා එවා තිබුණි. | සමහර ආයතනවල ණය හිමි ලිපිගොනුවට අනුව පෙර ලිපිනය නිවැරදි බැවින් එම ලිපිනයට ලිපිය නිකුත් කිරීමට කටයුතු කර ඇත. අධිකාරිය වෙත ලබාදී ඇති ලිපිනය වෙනස් වී ඇත්නම් ලිපිනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | නිවැරදි ලිපිනයන් නොමැතිවීම හේතුවෙන් නැවත හරවා එවා තිබූ ශේෂ සනාථ වල ලිපිනයන් පිළිබඳ සොයා බලා ඒවා නිවැරදි කිරීම කළ යුතුය. |
| (ඒ) | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ තහවුරු කරගැනීම සඳහා යැවූ රු. මිලියන 66.3 ක වටිනාකමින් යුත් ණයහිමියන් 17 ක් රු. මිලියන 14.7 ක වෙනසක් සහිතව ශේෂ සනාථ ඉදිරිපත් කර තිබූ අතර රු. මිලියන 424.8 ක වටිනාකමින් යුත් ණයගැතියන් 13 ක් රු. මිලියන 416.9 ක වෙනසක් සහිතව ශේෂ සනාථ ඉදිරිපත් කර තිබුණි. | අධිකාරියේ ශේෂ සමඟ එකඟ නොවන ශේෂ සඳහා විස්තරාත්මක පැහැදිලි කිරීම් හා පරස්පරතාවයක් වේ නම් ඒ පිළිබඳ අදාල ආයතනයන් සමඟ සාකච්ඡා කර ඉදිරියේදී අදාල ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනස්කම් සහිතව ඉදිරිපත් කරන ලද ශේෂ සනාථ සම්බන්ධයෙන් ණයගැති ශේෂ සැසඳුම් ප්‍රකාශයක් සකස් කර වෙනසට හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) | නැව් නියෝජිත ආරක්ෂක තැන්පතුවලට අදාලව රු.මිලියන 80.5 ක වටිනාකමින් යුත් නැව් නියෝජිතයන් 3 ක් රු. මිලියන 19.6 ක වෙනසක් සහිතව ශේෂ සනාථ ඉදිරිපත් කර තිබුණි. | ශේෂ වෙනස සම්බන්ධයෙන් අදාළ නැව් නියෝජිත ආයතනයන්ගෙන් විමසා සිටි නමුත් මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. අදාළ ආයතනය සමග සාකච්ඡා කොට පිළිතුරු ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | වෙනස්කම් සහිතව ඉදිරිපත් කරන ලද ශේෂ සනාථ සම්බන්ධයෙන් වෙනසට හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඕ) | ශ්‍රී ලංකා වරාය කළමනාකරණ උපදේශන සේවා සමාගම (SLPMCS) විසින් ගාලු මුවදොර පිටියෙහි නඩත්තු | එකඟ වේ. ගාලු මුවදොර පිටියෙහි නවීකරණ කටයුත්තක් වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2018 | මෙම මුදල අදාල සමාගමෙන් අයකර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | කටයුතු සිදු කිරීම වෙනුවෙන් අධිකාරිය වෙත කොමිස් ලෙස ලැබිය යුතු රු.940,230 ක මුදලක් සහ ගාලු මුවදොර පිටියෙහි නවීකරණ කටයුත්තක් වෙනුවෙන් අධිකාරිය විසින් 2018 වර්ෂයේදී වැය කර තිබූ රු.මිලියන 7.61 ක මුදල එම සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයේ දී වැයකර තිබෙන රු. 7,609,035.79 ක මුදල ආශ්‍රිත සමාගමක් වන ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සමාගමෙන් ලැබිය යුතු මුදලක් ලෙස අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබෙන අතර, එය පොත් වලින් කපා හැරිය යුතු බවට අනුමැතියක් මේ වන තෙක් ලැබී නොමැත. | කළයුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ වරායට අදාළව නැව් නියෝජිතයින් විසින් කලින් ගෙවන ලද අත්තිකාරම් පියවීමෙන් පසු, 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති ශේෂය රු. මිලියන 997.83 කින් රු.මිලියන 197.31 ක් සහ මූල්‍ය ප්‍රකාශන තුළ නැව් නියෝජිත බැර ශේෂ ලෙස දක්වා තිබූ ඉන්වොයිස් වටිනාකමට වඩා වැඩියෙන් ගෙවන ලද රු. මිලියන 2,755 කින් රු.මිලියන 130 ක් මාස 06 සිට වර්ෂ 05 කාල පරාසයක් ගතවී ඇතත් විගණිත දිනය වන විටත් නිරවුල් කර නොතිබුණි. | ශේෂයන් සමඟ එකඟ වේ. කොළඹ වරායේ නැව් නියෝජිත අත්තිකාරම් ගිණුමේ ශේෂයෙන් 2023.05.15 දිනට මාස 06 ඉක්ම වූ ශේෂය රු.197,312,750.28 දක්වා නිරවුල් කර ඇති අතර නැව් නියෝජිත බැර ශේෂයෙන් මාස 06 ඉක්ම වූ බැර ශේෂය රු.130,230,144 දක්වා නිරවුල් කර ඇත. ත්‍රිකුණාමලය වරායේ නැව් නියෝජිත බැර ශේෂයෙන් 2023.05.15 වන විට රු. 265,608 ක් හා ගාල්ල වරායේ නැව් නියෝජිත බැර ශේෂය රු. 3,853,376.09 දක්වා නිරවුල් වී ඇත. | සේවා ලබා ගැනීම වෙනුවෙන් අධිකාරිය වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල්වලින් අදාළ සේවාව සැපයීමෙන් පසු ඉතිරිවන අත්තිකාරම් මුදල් හා වැඩිපුර ගෙවීම් පිළිබඳ විස්තරාත්මක උපලේඛණ හා වයස් විශ්ලේෂණ, පිළිබඳ සැලකිල්ලට ගෙන කල්ගිය සහ චලනය නොවන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ මිලදී ගැනීම් වෙනුවෙන් විවිධ අවස්ථාවලදී සැපයුම්කරුවන් වෙත ගෙවූ රු.මිලියන 331 ක් වූ අත්තිකාරම් ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ 2004 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලය තුළ ගෙවීම් කරන ලද රු.මිලියන 1.5 ක ශේෂයක් ද මාස 2 ඉක්මවූ රු.මිලියන 30 ක ශේෂයක් ද 2022 දෙසැම්බර් 31 දිනට නොපියවා පැවතුණි. | මෙම ශේෂ සඳහා විගණන කමිටු රැස්වීමේදී (අංක 02/2023 රැස්වීම) ලබා දුන් උපදෙස් පරිදි කමිටුවක් මගින් ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳව වාර්තාවක් සකස් කරමින් පවතී. ඉතිරි රු. මිලියන 329.5 ශේෂයෙන් රු. මිලියන 304.5 ක පමණ ප්‍රමාණයක් පියවීම කර ඇති අතර ඉතිරි ලිපිගොනුවල අදාළ ලියකියවිලි සම්පූර්ණ වූ වහාම නිරවුල් කොට ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මිලදී ගැනීම් සිදු වූ වහාම අත්තිකාරම් පියවා අදාළ ගිණුම්වලට ගත යුතුය. |
| (ඇ) | 2022 නොවැම්බර් 21 දිනැති අංක මුකො/මුගි/කො/41/2022 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 2.12 වගන්තිය හා 8.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් අංක 142342 යටතේ පවතින ප්‍රාග්ධන වියදම්වලට අදාළ අත්තිකාරම් ගෙවීම්වල පවතින | වසර 05 ඉක්මවා ඇති රු. 2,783,834.60 ක මුදල ඉවත් කිරීමට හෝ ඉදිරියට පවත්වාගැනීම පිළිබඳව කටයුතු කරන මෙන් අදාළ නිළධාරීන් දැනුවත් කර ඇත. වසර 03 ඉක්මවූ රු. 134,841.17 ක මුදල ප්‍රාග්ධනිත කර මේ වන විට අත්තිකාරම් ගිණුමෙන් ඉවත් කර ඇත. රු. 7,269,570 | අදාළ මිලදී ගැනීම් සිදු වූ වහාම අත්තිකාරම් පියවා අදාළ ගිණුම්වලට ගත යුතුය. |

| | |
|---|---|
| පැරණි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුව ද, වර්ෂ 05 ඉක්මවූ රු. මිලියන 2.7 ක ශේෂයක් හා වර්ෂ 03 ඉක්මවූ රු.134,841 ක ශේෂයක් නිරවුල් නොවී (ප්‍රාග්ධනිත නොකර) පැවතුණි. තවද, රු. මිලියන 7.2 ක වටිනාකමින් යුත් අත්තිකාරම් ගෙවීම් 03 කට අදාළ ව්‍යාපෘති හඳුනාගැනීමට නොහැකි වීම හේතුවෙන් එකී අත්තිකාරම් මුදල් ප්‍රාග්ධනිත නොකර පැවතුණි. | වටිනාකමකින් යුතු අත්තිකාරම් ගෙවීම් ව්‍යාපෘති 03 පිළිබඳව විස්තර හඳුනාගෙන ඇත. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත | | | |
| (i) | 10 (5) වගන්තිය සහ 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 30 වගන්තියෙහි (අ), (ආ) හා (ඇ) ඡේද | යම් වර්ෂයක අතිරික්තයක් තිබේ නම් පනතේ දක්වා ඇති අඩු කිරීම් කළ පසු ඉතිරිය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු අතර වරායවල් පිළිබඳ පනත අනුව අධිකාරියට පවරන ලද වත්කම්වල අගය සහ අධිකාරියට ලබාදුන් මූල්‍යමය දායකත්වය මත වර්ෂයකට සියයට 8 ක් නොඉක්මවන ලාභාංශයක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. 1979 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 43 ක් තුළ අධිකාරිය විසින් ලාභ ඉපයූ වර්ෂ සඳහා පමණක් ස්කන්ධ ප්‍රාග්ධනය මත ගෙවිය යුතු උපරිම ලාභාංශ රු. මිලියන 15,383 ක් වූ අතර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණේ රු.මිලියන 1,585 ක් එනම් සියයට 10 ක් පමණි. කෙසේ වුවද, 2020 හා 2021 වර්ෂ සඳහා රු. මිලියන 39,433 ක් වූ බදු පසු ලාභයෙන් රු. මිලියන 985 ක් එනම් සියයට 2 ක් පමණක් ලාභාංශ ලෙස මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය වෙත කිසිදු | එකඟ නොවේ. ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය පිහිටුවීමේදී රජය විසින් දරණ ලද ප්‍රාග්ධනයෙන් (Equity Capital) 8% ක උපරිමයකට යටත්ව ලාභාංශ ලබාදිය යුතු බව සඳහන් කර ඇත. කෙසේ වුවද 2019 වර්ෂයේ දී 1979 අංක 51 වරාය අධිකාරිය පිහිටුවීමේ පනතේ 30 (1) (c) වගන්තියට අනුව ස්කන්ධ ප්‍රාග්ධනයෙන් 8% ක් වූ රු. මිලියන 600 ක මුදලක් සහ 2022 වර්ෂයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022.10.31 දින ලිපියෙන් හා අංක PAM/208/2022 දරන 2022.10.26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් ලද අනුමැතිය මත පදනම්ව 2020 හා 2021 වර්ෂ සඳහා | මුදල් පනතේ සහ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන අනුව අතිරික්ත හා ලාභාංශ සම්බන්ධයෙන් කටයුතු කිරීම කළමණාකරණයේ වගකීමක් ලෙස සලකා කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මුදලක් ප්‍රේෂණය කර නොතිබුණි. | රුපියල් මිලියන 1000 ක මුදලක් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් පමණක් ගෙවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කළ මුළු මුදල රු.මි.1,600 ක් (2019 හා 2022 වර්ෂවලදී) බව පෙන්වා දෙමි. | |
| (ii) | 11 වගන්තිය | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් ස්ථාවර සහ කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කරන ලද රු. මිලියන 104,533 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | 2022.12.31 දිනට වර්ෂයේ කෙටිකාලීන සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද මුදල් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට වරාය හා නාවික අමාත්‍යාංශය මගින් ලිපි ඉදිරිපත් කර ඇත. | අධිකාරිය විසින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 1646 සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2003 අප්‍රේල් 25 දිනැති අංක 10/2003 චක්‍රලේඛය | ගමන් පිළිබඳ මාසික සාරාංශය වාහන භාර නිලධාරීන් විසින් වාර්තා ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර 268 (අ) වැනි පොදු ආකෘති පත්‍රයේ ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමග ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | එකඟ වේ. වාර්තාවේ සඳහන් ප්‍රමාදයන් වළක්වා ගනිමින් නියමිත දිනට දෛනික ධාවන සටහන් පත් හා මාසික සාරාංශ වාර්තාව ඉදිරිපත් කරන ලෙස අදාළ නිළධාරීන්ට උපදෙස් දෙන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, ගමන් පිළිබඳ සාරාංශ වාහන භාර නිලධාරීන් විසින් පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ IV වන පරිච්ඡේදයේ 3.3 වගන්තිය | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් ස්ථිර පදනම මත පුරවන තෙක්, ඒ පුරප්පාඩුවට අනියම් පදනමක් මත නිලධරයෙකු බඳවා ගැනීමෙන් වැළකිය යුතු බවත් හදිසි අවශ්‍යතාව නිසා අතුරු පූරක අනියම් පත්වීමක් කරනු ලැබුවහොත් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව ස්ථිර නිලධරයෙකු පත් කිරීමට වහා පියවර ගත යුතු බවත් සඳහන් වුවද, ඒ අනුව කටයුතු නොකළ තනතුරු 344 ක් වර්ෂ 23 ක් වැනි | අධිකාරියේ වැඩ බැලීමේ පදනම සඳහා පත්කිරීම සිදුකරනුයේ අදාළ තනතුරේ කාර්ය හා කර්තව්‍යයන් ඉටුකර ගනිමින් වරාය අඛණ්ඩ සේවාවන් ඵලදායීව තහවුරු කරමින් ක්‍රියාත්මක කිරීම සඳහාය. එහිදී කලින් කලට ක්‍රියාත්මක වන චක්‍රලේඛ හා රජයේ පොදු තීරණයන් හේතුවෙන් පුරප්පාඩුව පවතින තනතුරු සඳහා | අධිකාරියේ පවතින පුරප්පාඩු වැඩ බැලීමේ පදනම මත නොව නිසි පරිදි බඳවාගැනීමේ පටිපාටියට අනුව බඳවාගෙන සම්පූර්ණ කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | ස්ථිර වශයෙන් සේවකයෙකු පත්කිරීම සිදුකළ නොහැකි වූ අවස්ථා පවතින බැවින්, වාර්තාවේ දක්වන ලද නිරීක්ෂණයන් පැවතිණි. | |
| (ඇ) | 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ (v) කොටසෙහි 38 (1) (අ) සහ (ආ) වන වගන්ති | අත්අඩංගුවට ගන්නා ලද හෝ රාජසන්තක කරන ලද භාණ්ඩ රේගුව විසින් බැහැර කරනු ලබන්නේ නම් අධිකාරියට ගෙවිය යුතු සියලුම ගාස්තු රේගුව විසින් අධිකාරියට ගෙවිය යුතුය. නමුත් අත්අඩංගුවට ගත් කන්ටේනර් 6 ක් සඳහා අධිකාරියට අයවිය යුතු රු.මිලියන 22.5 ක් එසේ අයකරගෙන නොතිබුණි. | එකඟ නොවේ. ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කරන ලද බහලු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තු විධිවිධාන පරිදි බහලු මෙහෙයුම් ගාස්තු සඳහා පමණක් ශ්‍රී ලංකා රේගුව වෙත බිල්පත් නිකුත් කරනු ලබන අතර බිම් කුලී ගාස්තු හෝ ගබඩා ගාස්තු සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත බිල්පත් නිකුත් නොකරයි. එබැවින් විගණන විමසුමෙහි පෙන්වා දී ඇති බහලු මෙහෙයුම් ගාස්තු (Wharf handling) සඳහා මේ වන විටත් ශ්‍රී ලංකා රේගුව වෙත අදාළ බිල්පත් නිකුත් කර ඇත. එහෙත් මේ වන තෙක් අදාළ ගෙවීම් කටයුතු සිදු කර නොමැත. | වරාය පනත ප්‍රකාරව වරායට ගෙවිය යුතු සියළු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1980 අංක 26 දරන ආහාර පනතේ 7 වන හා 32 වන වගන්තිය සහ ලංසුකරුවන්ට ලබාදුන් උපදෙස් මාලාවේ 4.18 වගන්තිය සහ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 2019 ජූනි 14 දිනැති 2019 ආහාර (පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ) නියෝගය | බේකරි ආහාර නිෂ්පාදකයන් විසින් එහි සඳහන් නියමිත ආකෘති පත්‍ර යටතේ ලියාපදිංචිය සඳහා අයදුම්කර එම ආහාර නිෂ්පාදන ස්ථාන සඳහා බලපත්‍රයක් ලබාගත යුතු නමුත් කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන්ට එලෙස බලපත්‍රයක් පවතීද යන්න ඇගයීමට ලක්වී නොතිබුණි. | මෙම ප්‍රසම්පාදනයේ කටයුතු කරගෙන යාම සඳහා වරාය අධිකාරිය තුළ පත් කළ විශේෂඥයින්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවට මුළුතැන්ගෙවල් අංශයද නියෝජනය කරමින් සාමාජිකයෙක් දඇතුළත් විය. මෙම කමිටුව මගින් බේකරි නිෂ්පාදන ආයතනය සඳහා ලබා ගතයුතු බලපත්‍ර සම්බන්ධව දැනුවත් කිරීමක් සිදු නොකරන ලද අතර ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් පත්‍රිකාවටද ඇතුළත් කිරීමක් | ප්‍රසම්පාදනයේදී අවශ්‍ය බලපත්‍ර තිබේද යන්න පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සිදුනොවීය. | |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) | 3.2 (i) ඡේදය සහ 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ලිපිය | යම් ආයතනයක් විසින් බඳවාගැනීමේ කාර්යය පටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගතයුතු වුවත් අධිකාරිය විසින් කෙටුම්පත් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි සකස්කර තිබුණද ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුව සකස් කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට 2022.03.31 දින අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ද වරාය අධිකාරියේ සේවක සංඛ්‍යාව, සංවිධාන ව්‍යුහය හා බඳවා ගැනීමේ පරිපාටි නැවත වරක් සමාලෝචනය කළයුතු බවට රේඛීය අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ වරාය අධිකාරියේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමේදී තීරණය විය. ඒ අනුව මේ වන විට සේවක සංඛ්‍යා පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යයන කරමින් සිටින අතර, එය අනුමත කළ පසු බඳවා ගැනීම් පරිපාටි සමාලෝචනය කිරීමට නියමිතය. | චක්‍රලේඛ විධිවිධාන පරිදි බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර විධිමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව.<br>2022 ජූනි 22 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා අවස්ථාවේදී යෝජනා වූ පරිදි තරඟකාරී පර්යන්තවල සේවක සංඛ්‍යා පිළිබඳව සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩලය සහ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කළ යුතු බව ද දන්වා ඇති අතර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 3.4 වගන්තිය | නව තනතුරක් නිර්මාණය කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාවේ වැඩි කිරීමකට පෙර නියමාකාරයෙන් රැකියා ඇගයීමක් | 2013 වර්ෂයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කරනු ලැබූ සේවක | නිසි රැකියා ඇගයීමක් සිදුකර නව කාර්යය මණ්ඩල සහ බඳවාගැනීමේ |

| | | | | |
|---|---|---|---|---|
| | | හා අධ්‍යයනය කිරීමක් සිදුකළ යුතු වුවද, අධිකාරියේ අංශ 10 ක සේවක සංඛ්‍යාවේ 282 ක අතිරික්තයක් පැවති අතර රැකියා ඇගයීමක් හෝ කාර්ය මණ්ඩල අධ්‍යයනයක් සිදු කිරීමකින් තොරව එම අංශයන්වලට සේවකයන් බඳවාගැනීම් කර තිබුණි. | සංඛ්‍යාව තුළ ඒ ඒ කොට්ඨාශවලට අයත් සේවක සංඛ්‍යාව නව පරිපාලන ගොඩනැගිල්ලකට ගෙනඒම පදනම් කරගෙන සැලසුම් කර තිබූ සේවක සංඛ්‍යාවක් වුවත් එසේ ස්ථාන ගත වීමට නොහැකි වීම මත 2013 අනුමත කරනු ලැබූ සේවක සංඛ්‍යාව හා තනතුරු රාජකාරී කොට්ඨාශ මට්ටමින් සිදු කිරීමේදී පවතින තත්ත්වය මත ඒ ඒ කොට්ඨාශයන්ට අනුමත සේවක සංඛ්‍යාව නිසි ආකාරයට ගණනය කර බඳවා ගැනීම හා රැකියා ඇගයීමක් සිදු කිරීමට අපහසු වුවත්, ඉදිරියේදී අනුමත සේවක සංඛ්‍යාව අනුව කොට්ඨාශවලට අයත් තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ හැකි වේ. | පටිපාටියන් ඉක්මණින් සකස් කරගත යුතුය. |
| (iii) | 3 වන පරිච්ඡේදයේ 3.4 වගන්තියේ ix වන උපවගන්තිය | යම් විශේෂිත අවස්ථාවලදී වැඩ බැලීමේ තනතුරක් ඇති කරනු ලැබූ විට එය වසරක කාල සීමාවකට සීමා විය යුතු බව සඳහන් වුවද, අධිකාරිය විසින් වැඩ බැලීම සඳහා පත්කළ වසරක කාල සීමාව ඉක්මවූ තනතුරු 13 ක් සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අධිකාරියේ වැඩ බැලීමේ පදනම සඳහා පත්කිරීම සිදුකරනුයේ අදාළ තනතුරේ කාර්ය හා කර්තව්‍යයන් ඉටුකර ගනිමින් වරාය අඛණ්ඩ සේවාවන් ඵලදායීව තහවුරු කරමින් ක්‍රියාත්මක කිරීම සඳහාය. එහිදී කලින් කලට ක්‍රියාත්මක වන චක්‍රලේඛ හා රජයේ පොදු තීරණයන් හේතුවෙන් පුරප්පාඩුව පවතින තනතුරු සඳහා ස්ථිර වශයෙන් සේවකයන් පත්කළ නොහැකි විය. | මෙම පුරප්පාඩු විධිමත්ව පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (උ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර | | | |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛය සමග නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොත | | | |
| (i) | 6 වන පරිච්ඡේදයේ 2 හි (i) සහ (ii) වගන්තිය | රාජ්‍ය හිමිකාරත්වයක් ඇති අවසාන වර්ෂ 02 ක ඒකාකාරී වාර්ෂික අවම ආදායම රු.මිලියන 30 ක් උපයන රාජ්‍ය ආයතනවල අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා ආයෝජන කමිටුවක් (Investment Committee) පිහිටුවා ඒ අනුව කටයුතු කළයුතු අතර එම කමිටුව අවම සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වියයුතු වුවත්, අධිකාරිය විසින් එවැනි කමිටුවක් පත්කර නොතිබුණි. | එකඟ නොවේ. අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා 2016 ජූලි 13 දින PA/HD/28 අංක දරණ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියේ සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇති අතර දෛනිකව සිදුකරන ආයෝජන සම්බන්ධයෙන් කමිටු අනුමැතිය ලබා ගැනීම සිදු කරනු ලැබේ. | අවශ්‍ය පරිදි ආයෝජන කමිටුවක් පිහිටුවා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 2.3 වගන්තිය | සියලු රාජ්‍ය ව්‍යවසායන් තම ආයතනයට අයත් ප්‍රධාන මෙහෙයුම් කටයුතු සඳහා ඒවා සිදු කරන ආකාරය පිළිබඳ ක්‍රියාවලි අත්පොතක් ද පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා ක්‍රියාවලි අත්පොතක් ද සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන කලින් කලට සමාලෝචනය කර යාවත්කාලීන කිරීම සිදුකළ යුතු වුවද, අධිකාරියේ දැනට ක්‍රියාත්මකව පවතින "මුදල් කාර්යය පරිපාටි සංග්‍රහය-2013" හි ණය එකතු කිරීමේ ප්‍රතිපත්තිය හෝ ණය කාලසීමාවන් පිලිබඳව ප්‍රතිපාදන ඇතුළත් කර ක්‍රියාවලි අත්පොත යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් කාර්ය පටිපාටි සංග්‍රහය-2013 යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | මුදල් කාර්යය පටිපාටි සංග්‍රහයට අදාළ යාවත්කාලීන කිරීම් ඉක්මණින් සිදුකර අභ්‍යන්තර පාලන දුර්වලතා මගහරවා ගත යුතුය. |
| (ඖ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ සංස්ථාපිත යහපාලන මාර්ගෝපදේශය | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2.2.5 වගන්තිය | පරිපාලිත සමාගම් සඳහා මව් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් (Board approved subsidiary policy) සකස් කර ඒ අනුව කටයුතු කළ යුතු වුවත් අධිකාරිය සතු පරිපාලිත සමාගම් සඳහා එවැනි ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | මේ සඳහා කාර්ය සාධන (Task force) කණ්ඩායමක් පත්කර ඇත. එම කණ්ඩායම 2023.05.22 දින වරාය, නාවික හා ගුවන් සේවා ගරු අමාත්‍යතුමා සමගද සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව ආයතනික සැලැස්මේ සහ පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියේ පළමු කෙටුම්පත කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | අධිකාරියට අයත් පරිපාලිත සමාගම් පවත්නා බැවින් පරිපාලිත සමාගම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කරන ලද පරිපාලිත සමාගම් ප්‍රතිපත්තියක් සකස්කර ඒ අනුව පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ii) | 3.2 වගන්තිය | සමාගම් පනත හැර වෙනත් ආකාරයකින් සංස්ථාපනය කරන ලද ආයතන සෑම වර්ෂයකම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා කාර්යසාධන සමාලෝචන රැස්වීමක් පැවැත්විය විය යුතු අතර එම රැස්වීම ශේෂ පත්‍ර දින සිට මාස 5 ක් ඇතුලත හා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර පැවැත්විය යුතු වුවද අධිකාරිය විසින් එවැනි රැස්වීමක් පවත්වා නොතිබුණි. | අධිකාරියේ කාර්යසාධන සමාලෝචන රැස්වීම 2023 ජූලි 31 දින පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් පසු පැවැත්වීමට නියමිතව ඇත. | නියමිත කාල රාමුව තුල කාර්යසාධන සමාලෝචන රැස්වීම් පවත්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතුය. |
| (iii) | 4.3 වගන්තිය | අවදානම් කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්‍ෂකවරු තිදෙනෙකු (03) නියෝජනය කළයුතු අතර ත්‍රෛමාසිකව කමිටුව රැස්විය යුතු වුවද, 2022 පෙබරවාරි 25 දින පත්කරන ලද අවදානම් කමිටුවෙහි දැනට සාමාජිකයන් දෙදෙනෙකුගෙන් (02) පමණක් සමන්විත වී තිබුණු අතර අවදානම් කමිටුව ත්‍රෛමාසිකව රැස් වී නොතිබුණි. | 2023.04.20 දින පැවති පැවති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී අවදානම් කමිටුව (Risk Committee) පත් කරන ලදී. | කමිටුව නිසි පරිදි රැස්වී අවශ්‍ය අවදානම් හඳුනාගැනීම් යනාදිය ඉක්මණින් සිදුකළ යුතුය. |
| (ඵ) | 2022 නොවැම්බර් 21 දිනැති අංක මුකො/මුගි/කො/41/2022 දරන 2022 ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය | සියළුම කොට්ඨාශ හා අංශ ප්‍රධානීන් විසින් ලබාගත් අත්තිකාරම් මුදල් අදාළ වර්ෂය අවසානයට පෙර නිරවුල් කළ යුතු වුවද, අධිකාරියේ විවිධ කොට්ඨාශ විසින් අවස්ථා 37 ක දී ලබාගත් අත්තිකාරම් රු. මිලියන | එකහ වේ. වාර්තාවේ පෙන්වා දී ඇති රු. මි. 5.8 ක ශේෂයෙන් 2020.10.28 දින යොමු කළ රු.391,949.34 ක් සහ 2022.04.22 දින යොමු කළ රු.137,500.00 ක | අත්තිකාරම් මුදල් ලබාදුන් පසු ඒවා ඉතා ඉක්මණින් නිසි පරිදි පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 2-12 වගන්තිය | 16.62 ක් පැවති අතර එම ශේෂය තුළ වර්ෂ දෙක ඉක්ම වූ රු. මිලියන 3.5 ක් හා මාස 6-12 අතර රු.මිලියන 5.8 ක් නොපියවා පැවතුණි. | අත්තිකාරම් මුදලක් නිරවුල් වී නොමැති බැවින් එම මුදල අයකර ගැනීම සඳහා නිරන්තරයෙන් කටයුතු කරමින් පවතී. | |
| (ඒ) | අධිකාරියේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ 9.5.2.1 වගන්තිය | එකම කොට්ඨාශයක වසර හයක සේවා කාලයක් සම්පූර්ණ කළ විධායක නොවන ව්‍යාපෘති සමීක්ෂණ සංවර්ධන සහකාර, කළමනාකාර සහකාර, වැඩ සහායක (විවිධ කාර්ය සහායක සහ සෞඛ්‍ය සේවක), රියදුරු ආදී තනතුරු දරන නිලධාරීන් 39 ක් පොදු ස්ථාන මාරු ක්‍රමය යටතේ වෙනත් කොට්ඨාශයක සේවය සඳහා ස්ථාන මාරු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පොදු ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී සේවයේ නියුතු විධායක සහ අනෙකුත් නිලධාරීන්, කොට්ඨාශ කිහිපයක ඉතා සුළු පිරිසක් පමණක් සේවා අවශ්‍යතාවය මත රඳවා ගැනීමට කටයුතු කර ඇත. එසේ වුවත්, ඉදිරියේදී චක්‍රලේඛ විධිවිධාන හා පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. | ආයතන සංග්‍රහය /පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඔ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 20 (5) වැනි වගන්තිය හා ක්‍රියාකරමින් 2022 මැයි 02 දිනැති අංක 2278/02 දරන රජයේ ගැසට් පත්‍රය | කිසිම නිෂ්පාදකයෙකු, සාදන්නෙකු, සැපයුම්කරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් සුදු බිත්තරයක් රු.43 කට හා දුඹුරු/ රතු බිත්තරයක් රු.45 ක උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළඳාම කිරීම, සැපයීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ වෙළඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට නියම කර තිබුණි. මෙම නියෝගය 2022 අගෝස්තු 19 වන දින සිට විගණන විමසුම් දින තෙක් බලපැවැත්වෙන අතර අධිකාරිය විසින් 2022 අගෝස්තු 19 දින සිට දෙසැම්බර් 31 දක්වා බිත්තර මිලදී ගැනීමේදී පාලන මිල පිළිබඳ සැලකීමකින් තොරව, පාලන මිල ඉක්මවා ඉදිරිපත් කර තිබූ ලංසු මිල ගණන් යටතේ බිත්තර මිලදීගැනීම සිදුකර තිබූ අතර එයින් අධිකාරියට සලකා බැලූ කාලච්ඡේදය සඳහා රු.මිලියන 1.1 ක අලාභයක් සිදුවී ඇත. | ආහාර වට්ටෝරු සකස් කිරීමේදී සේවකයින්ගේ පෝෂණය හා රුචිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන බැවින් සතියේ ආහාර වට්ටෝරුවට බිත්තර ද ඇතුළත් කර ඇත. බිත්තර මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පවත්වන ලද අවස්ථාවේදී රජය විසින් පනවා තිබූ පාලන මිල ඉක්මවා සැපයුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. එබැවින් අවශ්‍යතාවය සළකා එම මිල ගණන් අතුරින් අවම මිළ ඉදිරිපත් කර තිබූ සැපයුම්කරු ටෙන්ඩර් මණ්ඩලය මගින් තෝරා ගෙන බිත්තර මිළදී ගැනීම සිදු කර ඇත. | පාරිභෝගික අධිකාරිය පනවා ඇති පාලන මිලට යටත්ව බිත්තර මිලදී ගැනීම සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී (සංශෝධිත) පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින් 2022 මැයි 02 දිනැති අංක 2278/02 දරන රජයේ ගැසට් පත්‍රය | කිසිම නිෂ්පාදකයෙකු, සාදන්නෙකු, සැපයුම්කරුවෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් සුදු/ රතු සම්බා සහල් (දේශීය) කි.ග්‍රෑ.1 ක් රු.230 ක උපරිම සිල්ලර මිලට වඩා වැඩියෙන් වෙළඳාම කිරීම, සැපයීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ වෙළඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට නියම කර තිබුණි. මෙම නියෝගය 2022 මැයි 02 දින සිට විගණන විමසුම් දින තෙක් බලපැවැත්වෙන අතර අධිකාරිය විසින් 2022 ජූනි, ජූලි සහ අගෝස්තු මාසවලදී සුදු සම්බා සහල් මිලදී ගැනීමේදී පාලන මිල පිළිබඳ සැලකීමකින් තොරව පාලන මිල ඉක්මවා ඉදිරිපත් කර තිබූ ලංසු මිල ගණන් යටතේ සහල් මිලදීගැනීම සිදුකර තිබූ අතර එයින් අධිකාරියට සලකා ලැබූ මාස 03 සඳහා රු. මිලියන 1.4 ක අලාභයක් සිදුවී ඇත. | 2022 ජූනි, ජූලි සහ අගෝස්තු මාස සඳහා සුදු/රතු සම්බා සහල් මිලදී ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් එම අවස්ථාවේදී රජය සහල් සඳහා පනවා තිබූ පාලන මිළට වඩා වැඩි වූ නමුත් වරාය අධිකාරියේ මුළුතැන්ගෙවල් අංශයේ පවතින අවශ්‍යතාවය මත ටෙන්ඩරයෙන් තෝරාගත් මිල ගණන් අනුව සහල් මිලදී ගැනීමට කටයුතු කර ඇත. | පාරිභෝගික අධිකාරිය පනවා ඇති පාලන මිලට යටත්ව සහල් මිලදී ගැනීම සිදුකළ යුතුය. |
| (ක) | 2013 ජනවාරි 23 දිනැති අංක DMS/F1/3/3-1 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සංශෝධිත මානව සම්පත් සැලැස්ම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව සහ 2022 පෙබරවාරි 07 දිනැති අංක මාසකො/පා/01/ර.වි/2022 දරන ලිපිය | සුභසාධක සහ කාර්මික සම්බන්ධතා කොට්ඨාශයේ අනුමත සේවක සංඛ්‍යාව 122 ක් වන අතර 2022 නොවැම්බර් 28 දිනැති අංක මාසකො/පා/01/ර.වි/2022 දරන ලිපියට අනුව 2022 ඔක්තෝම්බර් 01 දිනට මුළුතැන්ගෙවල් අංශයේ සේවකයන් 167 ක් අනුයුක්ත කර තිබුණි. ඒ අනුව මුළුතැන්ගෙවල් අංශයේ සේවක සංඛ්‍යාවෙහි 45 ක අතිරික්තයක් පවතින බව නිරීක්ෂණය විය. | මුළුතැන්ගෙවල් අංශය විසින් ඉටු කළ යුතු වන විවිධ රාජකාරි බොහොමයක් පවතින බැවින් ඒවායේ ස්වභාවයන් මත දැනට සිටින සේවක මහතුන් සියල්ල සේවයේ යොදවා ගැනීමේ අවශ්‍යතාවය පවතී. මේ වන විට වරාය අධිකාරියේ නව මානව සම්පත් සැලැස්ම සැකසීමේ කටයුතු සිදු කරමින් පවතින අතර එය සැකසීමෙන් පසු අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කරනු ලැබේ. | සේවක බඳවාගැනීම් කිරීමේදී සේවා අවශ්‍යතා පිළිබඳ සොයා බලා නිසි ඇගයීමක් සිදුකර අවශ්‍ය බඳවාගැනීම් සිදුකළ යුතුය. |
| (ග) | 2022 අප්‍රේල් 26 දිනැති අංක BD/CBP/01/01/04- | සත්‍ය වශයෙන්ම සේවයේ නිරතවී සිටින බව/ පැමිණීම තහවුරු කර ගැනීමකින් තොරව සිදුකරනු | මධ්‍යම මුළුතැන්ගෙවල් අංශයේ මුළුතැන්ගෙවල්වල | අතිකාල දීමනා ලබාදීමේදී ඒ පිළිබඳ ඉතා සැලකිලිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | 2022 දරන මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රජයේ වියදම් පාලනය කිරීමේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි 3 (xiii) | ලබන සියලුම අතිකාල දීමනා ගෙවීම් අත්හිටුවීම හා විවිධ අයුරින් ලබාගන්නා අතිකාල දීමනාවන්හි එකතුව වැටුප ඉක්මවා නොයන පරිදි කටයුතු කළ හැකි ක්‍රමවේදයක් සකස් කිරීමට උපදෙස් ලබාදී තිබුණ ද මුළුතැන්ගෙවල් අංශ 01 හි සේවකයින් වෙනුවෙන් 2022 ඔක්තෝම්බර් 28 දිනැති අංක FD/SA1/2022/03 දරන ලිපිය සමග ඉදිරිපත් කළ තොරතුරු අනුව 2022 ජනවාරි සිට ජූලි මාසය දක්වා එසේ වැටුප ඉක්මවා අතිකාල දීමනා ලබාගත් සේවකයින් 72 ක් සිටි අතර ඔවුන් වෙනුවෙන් ලබාදුන් අතිකාල ගෙවීම් ද ඇතුළුව මුළු අතිකාල වටිනාකම රු.මිලියන 50.9 ක් විය. ඒ අනුව කළමනාකරණය විසින් වියදම් පාලනය සඳහා අවශ්‍ය පරිදි කටයුතු කර නොමැති බවට විගණනයේදී නිරීක්ෂණය විය. එසේම, මුළුතැන්ගෙවල් අංශයේ දැනට භාවිතා කරන අතිකාල ගැලපුම් ක්‍රමය සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව කළමනාකරණය විසින් දන්වා සිටින ලදී. | සේවය කරන සේවක මහතුන් පැය 24 ක මුර ක්‍රමයට සේවය සඳහා වාර්තා කළ පසු ඉන් පැය 08 ක් අතිකාල ලෙස සලකනු ලබයි. ඊට අමතරව ඔවුන් දිරිගැන්වීම සඳහා නිෂ්පාදනය කරන ආහාර ප්‍රමාණය සළකා බලමින් විශේෂ අතිකාල (Target OT) ගෙවීමක් හා රාජකාරීන්වල ස්වභාවය මත අතිකාල ගෙවීමක් අතීතයේ සිට මේ දක්වා සිදු කරනු ලැබේ. එසේම තේ සැපයුම් අංශයේ අතිකාල ගණනය කිරීමද එම අංශයේ රාජකාරිවල ස්වභාවය මත සිදු කරනු ලබයි. මෙම අතිකාල ගෙවීමේ ක්‍රමවේදය අතීතයේ සිට මුළුතැන්ගෙවල් අංශයේ ක්‍රියාත්මක කරන ක්‍රම වේදය වන අතර එය වෙනස් කිරීම සේවක නොසන්සුන්තාවය ඇතිවීම හා කාර්මික සාමය බිඳ වැටීමට ද හේතු වනු ඇත. කෙසේ වෙතත්, මේ සම්බන්ධව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලෙස කටයුතු කර අනවශ්‍ය ලෙස අතිරේක අතිකාල දීමනාවන් ලබා නොදිය යුතුය. |
| (ච) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5:3:1 වගන්තිය | රජයේ නිවාසයක පදිංචි වන නිලධාරීයෙකුගේ නිල නිවාස කුලිය ලෙස ඔහු විවාහකයෙකු නම් මාසික වැටුපෙන් සියයට 10 ක් ද අවිවාහකයෙකුගේ නම් සියයට 5 ක් ද ලෙස රජයට අය කර ගත යුතුවේ. අධිකාරියේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ (X) වන පරිච්ඡේදයෙහි අඩංගු නොවන යම් කරුණු වේ නම් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ අඩංගු ප්‍රතිපාදන සැලකිල්ලට ගත යුතු බව සඳහන් කර තිබූ නමුත් නිල | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ 330 හා 331 ඡේද හා ඊට අමතරව අධිකාරිය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන අතර නිවාස කුලිය සම්බන්ධයෙන් අංක 02/2021 හා 2021/01/31 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බැවින් ආයතන සංග්‍රහය අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. | නිල නිවාස කුලිය අයකර ගැනීමේදී අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිවාස වල කුලිය නිලධාරීන්ගෙන් අය කර ගැනිම සඳහා ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තවද අවිවාහක අය සඳහා නිල නිවාස ලබා දීමක් සිදු නොකරයි. | |
| (ජ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2021 ජනවාරි 30 දිනැති අංක 02/2021 චක්‍රලේඛයේ 07 ඡේදයේ I හා II වගන්ති | (i) පදිංචි කාලසීමාව වර්ෂ 05 ක් සම්පූර්ණ වීමෙන් අනතුරුව නිල නිවසේ රැඳී සිටීම සඳහා නැවත ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට හැකි බව සඳහන් කර තිබුණ ද, වසර 05 ක් ඉක්මවා එකම නිල නිවාසයේ පදිංචිව සිටින නිලධාරීන් 399 දෙනාම 2022 දෙසැම්බර් 31 දිනට අදාල නිවාසවල පදිංචිය සඳහා නව ඉල්ලුම්පත්/ ගිවිසුම් අළුත්කිරීමේ ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ සඳහන් පරිදි නිල නිවසේ රැඳී සිටීම සඳහා සේවා අවශ්‍යතා මත හා ලකුණු පදනම මත නැවත ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු බව සඳහන් වුවද, වසර 05 ක් ඉක්මවා සිටින අය ඉවත් කිරීම සම්බන්ධයෙන් නිවාස කමිටුව විසින් මෙතෙක් තීරණයක් ගෙන නොමැති බැවින් ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුම්දීමට කටයුතු කර නොමැත. | නිල නිවාස නැවත ලබාගැනීමට අවශ්‍ය නම් අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | (ii) අධිකාරියේ නිළධාරීන්ට ලබාදෙන නිල නිවාස සඳහා වූ පදිංචි කාලසීමාව, පළමුව නිවාස ලබා දුන් දින සිට වසර 5 ක උපරිමයකට සීමා වන අතර, එම කාලසීමාව සම්පූර්ණ වීමෙන් පසුව තවත් මාස 06 ක කාලයක් පදිංචිව සිටින නිලධාරියා නිල නිවාසයට ගෙවිය යුතු කුලී මුදලින් දෙගුණයක් ගෙවිය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 මාස 06 ක් ඉක්මවා සහ වර්ෂ 28 තෙක් කාල පරාසයක් තුල අදාල නිල නිවාසවලින් ඉවත් වී නොගොස් රැඳී සිටින නිලධාරීන් සංඛ්‍යාව 399 ක් වී තිබුණි. | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2021.01.31 දිනැති අංක 02/2021 චක්‍රලේඛයට අනුව මේ වන විට නිළ නිවෙස් වල වසර 05 ඉක්මවා පදිංචිව සිටින සේවක මහත්ම මහත්මීන්ගෙන් කුලිය වශයෙන් දෙගුණයක් අය කරනු ලබයි. වසර 05 ට වැඩි කාලයක් නිල නිවාස වල පදිංචි සේවකයන් සම්බන්ධයෙන් කළමණාකාරිත්වය තීරණය කොට ඇත්තේ යම් යම් මානුෂීය හේතූන් මත මොවුන් නිවාස වලින් ඉවත් කිරීම අපහසු බැවින් විකල්ප ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කිරීමටය. ඒ අනුව 02/2021 චක්‍රලේඛය සඳහා සංශෝධනයන් කිරීමට නියමිතය. | නිල නිවාස වල තවදුරටත් රැඳීසිටීමට අවශ්‍ය නම් ගෙවීම් කර අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | | |
| (i) | 3 (2) (ඇ) (iii) වගන්තිය අනුව (ඇ) (i) සහ (ii) අනු ඡේදවල දක්වා ඇති සේවා සහ පළමුවන උපලේඛනයේ ii වන කොටසේ සඳහන් යම් නිදහස් කරන ලද සේවාවක් හැර, ශ්‍රී ලංකාව තුළ යම් සේවාවක් සැපයීම මඟින් ලැබිය යුතු මුදල, මුදලින් ලැබුවා හෝ නොලැබුවා වුවද බද්දට යටත් ආදායම් සේ සැලකෙන අතර අධිකාරිය විසින් 2022 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේදී රාජ්‍ය භාග (Royalty Income) ආදායම, බදු අයකළ හැකි ආදායමෙන් ඉවත්කර තිබුණි. | එකඟ නොවේ<br><br>සමාජ ආරක්ෂණ බදු පනතෙහි Section 02 අනුව මෙම පනත අදාළ වන ලෙස දක්වා ඇත්තේ (a), (b), (c), (d) යටතට ගැනෙන බද්දට යටත් ආදායම් සඳහා වේ.<br><br>තවද, මෙම වාර්තාවේ දක්වා ඇති සමාජ ආරක්ෂණ බදු පනතෙහි 3 (2) ඇ (III) වගන්තියෙහි අඩංගු වන ඉහත සඳහන් කර ඇති Part 1 අනු අංක 02 යටතේ දක්වා ඇති නිර්වචනයන්ට අනුකූලවන රාජ්‍ය භාගය (Royalty income) සේවා සැපයීමක් වෙනුවෙන් උපයා ගන්නා ආදායමක් නොවන හෙයින් මෙම ආදායම ඉවත් කොට SSCL බදු වගකීම ගණනය කොට ඇත. | සමාජ ආරක්ෂණ බදු වෙන්කිරීමේදී එම බද්දට යටත් සියළු ආදායම් අදාළ ගණනය කිරීමට යොදාගත යුතුය. |
| (ii) | පළමුවන උපලේඛනයේ ii වන කොටස ප්‍රකාරව සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගණනයේදී, බද්දට යටත් ආදායම ගණනය කිරීමේදී ශුන්‍ය අනුපාතය යටතේ එකතු කළ අගය මත බද්දට යටත් වන ආදායම් බාණ්ඩ (VAT Zero Rated Revenue) වන ගබඩා ගාස්තු, උපකරණ කුලියට දීමේ සහ ගිනි නිවීමේ සේවා සැපයීමේ ආදායම් යන රු.මිලියන 1,072 ක් වූ ආදායම්, සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ද නිදහස් ආදායම් ලෙස ගණනය කර තිබීම හේතුවෙන් රු. මිලියන 26.8 ක සමාජ ආරක්ෂණ බද්දක් ගෙවා නොතිබුණි. | එකඟ නොවේ.<br>2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ බදු පනතෙහි 1 වන උපලේඛණයෙහි II වන කොටසෙහි බදු නිදහස් සේවා (Exempted services) දක්වා ඇති අතර Item 05 හා Item 08 වරාය අධිකාරිය අදාල කරගෙන ඇත.එ් අනුව අධිකාරිය විසින් සපයනු ලබන බොහෝමයක් සේවාවන් Export related services වන අතර එය එක් එක් Revenue categories අනුව නිශ්චිතවම වෙන් කර හඳුනා ගත යුතු හෙයින් එකී කාර්යය ක්‍රියාකරවන කොට්ඨාශයේ ද සහය ඇතුව මේ වන විට සිදු කරමින් පවතී. | සමාජ ආරක්ෂණ බදු ගණනයේදී බදු පනතට අනුව නිදහස් භාණ්ඩ පමණක් නිදහස් ලෙස සලකා අදාළ ගණනය කිරීම් සිදුකළ යුතුය. |
| (ආ) | 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 2 (1) (අ) වගන්තිය අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රු. මිලියන 2000 ක් ඉක්මවනු ලබන තනි පුද්ගලයන්ගේ, හවුල් ව්‍යාපාර හෝ සමාගමක, බදු අය කළ හැකි ආදායම මත සියයට විසිපහක ප්‍රමාණයකින් අයකරනු | එකඟ නොවේ. 2020/21 වර්ෂයට අදාළව ගොනුගත කළ ආදායම් බදු වාර්තාව අනුව බදු අයකළ හැකි ආදායම වන රු.මි. 7,809 පදනම් කරගෙන රු.මි. 1,952.2 ක අධිභාර බදු 2022 අප්‍රේල් මස ගෙවීම් කරන ලදී.නමුත් 2022 සැප්තැම්බර් මාසයේ දී ගොනුගත කළ ආදායම් බදු වාර්තාව නැවත සංශෝධනයකට ලක් කළ අතර එහිදී බදු අය කළ හැකි ආදායම රු.මි. 4,420.9 දක්වා අඩු විය. | වැඩිපුර ගෙවන අධිභාර බද්ද ඉක්මණින් නැවත අයකරගැනීමට හෝ ගෙවිය යුතු ආදායම් බදු වලින් හිලව්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

ලැබිය යුතුය. 2020/21 වර්ෂයේ අධිකාරියේ බදු අයකළ හැකි ආදායම වන රු.මිලියන 4,420.9 මත ගණනය කළ විට අධිභාර බද්ද රු. මිලියන 1,105.2 වුවද, අධිකාරිය රු.මිලියන 1,952.2 ක් අධිභාර බදු ලෙස ගෙවා තිබුණි. තවද, මෙලෙස වැඩිපුර ගෙවූ රු. මිලියන 847 ක මුදල 2022 අංක 14 දරන අධිභාර බද්ද පනතේ 5 (1) වගන්තිය ප්‍රකාරව නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

එමනිසා මෙලෙස රු.මි. 847 ක අධිභාර බද්දක් වැඩිපුර ගෙවීමට හේතු වූ අතර අධිභාර බද්ද පනතේ 5(1) ප්‍රකාරව නැවත අයකර ගැනීම සඳහා අධිභාර බදු වාර්තාව සංශෝධනය කර ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ ලාභය රු. මිලියන 37,870 ක් හා අධිකාරියේ ලාභය රු. මිලියන 42,319 ක් විය. ඉකුත් වර්ෂයේ සමූහයේ සහ අධිකාරියේ ලාභය පිළිවෙලින් රු. මිලියන 19,843 ක් සහ රු.මිලියන 20,695 ක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමූහයේ සහ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු. මිලියන 18,027 කින් සහ රු.මිලියන 21,624 කින් වැඩි වී තිබුණි. අධිකාරියේ පසුගිය වර්ෂයේ ආදායම රු. මිලියන 45,455 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු. මිලියන 68,408 ක් දක්වා වැඩි වී තිබුණි. එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම සහ පෙර වර්ෂයට සාපේක්ෂව පොලී ආදායම වැඩිවීම ඉහත දක්වා ඇති මූල්‍ය ප්‍රතිඵලය වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම රු.මිලියන 22,953 කින් හෙවත් සියයට 50.5 කින් වැඩිවී තිබූ අතර වෙනත් මෙහෙයුම් ආදායම රු. මිලියන 10,236 කින් හෙවත් සියයට 83.1 කින් වැඩිවී තිබුණි. පූර්ව වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් කටයුතු අඩු වී තිබුණ ද විනිමය අනුපාතයේ වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ආ) 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඍජු වියදම් හා පරිපාලන වියදම් පිළිවෙලින් සියයට 28.7 කින් සහ සියයට 44.1 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන මිල ඉහල යාම හා විදුලි බිල්පත් ගාස්තු ඉහල යාම ඍජු වියදම් වැඩි වීමට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### (අ) වරාය අධිකාරියේ හා අනෙකුත් පර්යන්තවල බහාලුම් මෙහෙයුම් (Container Handling) කටයුතු

2022 වර්ෂය අවසන් වන විට කොළඹ වරාය තුළ බහාලුම් හැසිරවීම ඇතුළු මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන පර්යන්ත 05 ක් පැවති අතර එයින් ජයබහාලුම් පර්යන්තය, සමඟි බහාලුම් පර්යන්තය සහ නැගෙනහිර බහාලුම් පර්යන්තය පූර්ණ වශයෙන් වරාය අධිකාරිය සතු විය. අනෙකුත් පර්යන්ත දෙක වන කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (C.I.C.T) හා දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (S.A.G.T) පුද්ගලික ආයතන දෙකක් වෙත සියයට 85 ක අයිතිය මත අවුරුදු 35 කට ඉදිකිරීම, මෙහෙයවීම සහ පැවරීම (Built, Operation & Transfer) යන පදනම යටතේ බදු දී තිබුණි.

2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කොළඹ වරායේ සියලු පර්යන්තවල දේශීය හා ප්‍රතිඅපනයන වශයෙන් බහාලුම් මෙහෙයුම් කටයුතු සිදු කළ ආකාරය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

| | ශ්‍රී.ල.ව.අ. (SLPA) ඒකක | | ද.ආ.පි.ප. (SAGT) ඒකක | | කො.ජා.බ.ප (CICT) ඒකක | | එකතුව ඒකක | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 | 2022 | 2021 | 2022 | 2021 |
| ප්‍රති නැව්ගත කිරීම (Transhipments) | 1,633,176 | 1,846,264 | 1,481,513 | 1,521,373 | 2,520,946 | 2,482,410 | 5,635,685 | 5,850,047 |
| දේශීය (Domestic) | 256,318 | 321,121 | 229,711 | 265,285 | 544,201 | 612,649 | 1,030,230 | 1,199,055 |
| නැවත පැටවීම (Re-Stowing) | 36,401 | 30,949 | 40,962 | 52,035 | 118,906 | 117,275 | 196,269 | 200,256 |
| | 1,925,895 | 2,198,334 | 1,752,236 | 1,838,693 | 3,184,053 | 3,212,331 | 6,862,184 | 7,249,358 |

මෙ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉකුත් වර්ෂ හා සැසදීමේ දී සමාලෝචිත වර්ෂය තුළ කොළඹ වරායේ මුළු බහාලුම් මෙහෙයුම්වල සහ ප්‍රතිනැව්ගත කිරීම්වල අඩුවීමක් (පසුබෑමක්) දක්නට ලැබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයේ වරාය අධිකාරියේ බහාලුම් මෙහෙයුම් සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසදීමේ දී 2,198,334 සිට 1,925,895 ක් දක්වා එනම් සියයට 12.4 කින් අඩුවී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සමස්ත බහාලුම් හැසිරවීමේදි අධිකාරිය සියයට 28 ක් ද දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (S.A.G.T) සියයට 26 ක් ද කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්ත සමාගම (C.I.C.T) සියයට 46 ක් ද වශයෙන් වෙළඳපල දායකත්වයක් හිමිකරගෙන තිබුණි. කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්ත සමාගම (C.I.C.T) ඉහළම දායකත්වය හිමිකරගෙන තිබූ අතර දැනට වරාය තුළ පිහිටි මීටර් 14.25 ට වැඩි නැව් පැමිණිය හැකි එකම පර්යන්තය එම පර්යන්තය වීම ඒ සඳහා හේතු වී තිබුණි.

(iii) අධිකාරියේ බහාලුම් මෙහෙයුම් කටයුතු සම්බන්ධ පර්යන්ත උපයෝජන අනුපාතය (Terminal Occupancy Ratio) සලකා බැලීමේ දී 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එය පිළිවෙලින් සියයට 64,70,72,70 සහ 63 ක් විය. ඒ අනුව අධිකාරියේ පර්යන්ත උපයෝජන අනුපාතය 2018 වර්ෂයේ සිට ක්‍රමානුකූලව වැඩි වෙමින් 2021 වර්ෂයේ සිට අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

**(ආ)**

i. නාවික යාත්‍රා පැමිණීම සම්බන්ධයෙන් සලකා බැලීමේදි 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය යන වරායන් වෙත පැමිණි යාත්‍රාවල සියයට 17ක පමණ අඩුවීමක් දක්නට ලැබුණු අතර එය 2018 දී 4,933 ක් වූ අතර 2022 වර්ෂයේදී 4,073 ක් වී තිබුණි. මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ යාත්‍රා වෙනුවට විශාල ප්‍රමාණයේ යාත්‍රා පැමිණීම මේ සඳහා හේතුවී තිබුණි.

ii. 2018 සහ 2019 වර්ෂයන්වලදී පිළිවෙලින් නාවික යාත්‍රා 59ක් සහ 11ක් කන්කසන්තුරය වරාය වෙත පැමිණ තිබූ අතර 2020 වර්ෂයේ සිට එකදු නාවික යාත්‍රාවක්වත් පැමිණ නොතිබූ බව නිරීක්ෂණය විය.

**(ඇ)** 2019,2020,2021 සහ 2022 වර්ෂයන්වල බහාලුම්ගත නාවික යාත්‍රා පැමිණීම පිළිවෙලින් 3,604, 3,281, 3,180, 3,287 ක් විය. ඉකුත් වර්ෂයයන් හා සැසඳීමේ දී 2021 හා 2020 වර්ෂ වලදී කොළඹ වරාය වෙත බහලුම්ගත නාවික යාත්‍රා පැමිණීම පිළිවෙලින් සියයට 3 හා සියයට 9 කින් අඩු වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී සියයට 3 කින් වැඩි වී තිබුණි. එසේම C.I.C.T පර්යන්තය වෙත පැමිණි යාත්‍රා සංඛ්‍යාව 2021 වර්ෂයේදී 1,027 ක් වූ අතර 2022 වර්ෂයේදී එය 1,146 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර වරාය අධිකාරියේ ජය බහලුම් පර්යන්තය, සමගි බහලුම් පර්යන්තය, නැගෙනහිර බහලුම් පර්යන්තය වෙත බහලුම් යාත්‍රා පැමිණීම 2021 වර්ෂයේදී 1,286 ක් වූ අතර 2022 වර්ෂයේදී එය 1,304 ක් දක්වා වැඩි වීමක් දක්නට ලැබුණි. තවද, S.A.G.T පර්යන්තය වෙත පැමිණි යාත්‍රා සංඛ්‍යාව 2021 වර්ෂයේදී 867 ක් වූ අතර 2022 වර්ෂයේදී එය 837 ක් දක්වා අඩු වී තිබුණි.

**වෙළඳපල කොටස**

2022 වර්ෂය සඳහා ලෝක වරාය මෙහෙයුම් පිළිබඳව නිකුත් කරන ලද ඇල්ෆා ලයිනර් වාර්තාව (Alpha Liner Report) අනුව කොළඹ වරාය විසිසම ඒකක (Twenty Equivalent Unit) 6,862,178 ක මෙහෙයුම් සිදුකරමින් ලෝකයේ 22 වෙනි ස්ථානයේ රැඳී සිටි අතර 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 5.3 ක පසුබෑමක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ බහාලුම් හැසිරවීම 2021 වර්ෂයයේදී බහාලුම් විසිසම ඒකක 2,198,334 ක් වූ අතර 2022 වර්ෂයේ දී එය බහාලුම් විසිසම ඒකක 1,925,895 දක්වා සියයට 5 කින් අඩු වී තිබුණි. තවද, කොළඹ වරාය තුළ වරාය අධිකාරියේ බහාලුම් මෙහෙයවීමේ ධාරිතාවය 2001 වර්ෂයේදී බහාලුම් විසිසම ඒකක 1,396,946 ක් වූ අතර 2022 වර්ෂයේදී එය බහාලුම් විසිසම ඒකක 1,925,895 දක්වා සියයට 81 සිට සියයට 28 තෙක් පහත වැටී තිබුණි.

කෙසේ නමුත්, කොළඹ වරාය තුළ තරඟකාරීව කටයුතු කරන පුද්ගලික සමාගම්වන S.A.G.T ආයතනයේ බහාලුම් විසිසම ඒකක 229,670 ක සිට බහාලුම් විසිසම ඒකක 1,749,809 ක් දක්වා එනම් සියයට 19 සිට සියයට 51 දක්වා ක්‍රම ක්‍රමයෙන් වැඩි වී සමාලෝචිත වර්ෂය වන විට සියයට 26 දක්වා ක්‍රම ක්‍රමයෙන් පහත වැටී තිබුණි. C.I.C.T ආයතනය 2013 වර්ෂයේදී බහාලුම් විසිසම ඒකක 57,541 සිට 2022 වර්ෂය වනවිට බහාලුම් විසිසම ඒකක 3,184,053 ක් දක්වා එනම් සියයට 01 සිට සියයට 46 දක්වා සීඝ්‍ර වර්ධනයක් ලබා කර ගෙන තිබුණි. ඒ අනුව, වරායේ ප්‍රධාන කාර්යය වන බහාලුම් මෙහෙයවීමේ කාර්යය වරාය අධිකාරියෙන් ක්‍රමානුකූලව ගිලිහී එය පුද්ගලික අංශය විසින් නතුකර ගනිමින් සිටින බව නිරීක්ෂණය විය.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ කොට්ඨාශ 25 මගින් ඉදිරිපත් කරන ලද කාර්ය මණ්ඩල විස්තර අනුව තනතුරු 86 කට අදාළ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 914 දෙනෙකු සේවයේ යොදවා තිබුණද අධිකාරියේ මෙහෙයුම් කටයුතු (Operations) සඳහා සෘජුවම සම්බන්ධතාවයක් දක්වන කොට්ඨාශයන්හි සේවකයන් 726 දෙනෙකු පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. එසේම අධිකාරියේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් සෘජුවම සම්බන්ධතාවයක් නොදක්වන කොට්ඨාශ 10 ක සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී අතිකාල දීමනා වශයෙන් රු. මිලියන 924 ක් ඇතුළුව අධිකාරියේ සමස්ත අතිකාල දීමනාව රු.මිලියන 11,968 ක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධිකාරියේ සේවක සංඛ්‍යාව වශයෙන් 9990 ක් අනුමත කර ඇත. තනතුරු කිහිපයක් ඒකාබද්ධ කොට අළුත් තනතුරු නිර්මාණය කර තිබීමත් සමහර තනතුරු අහෝසි වී යන ලෙස සලකා තිබීමත් එම තනතුරු සඳහා සේවකයින් බඳවා නොගැනීමත් හේතුවෙන් 2021.12.31 දිනට සමස්ථ සේවක සංඛ්‍යාව 8507 ක් දක්වා අඩුවී ඇත. අත්‍යාවශ්‍යයෙන් පිරවිය යුතු පුරප්පාඩු අභ්‍යන්තරව පිරවීමේදී සමහර තනතුරු සඳහා ඉහත සඳහන් අතිරික්ත ලෙස සලකන තනතුරුලාභීන්ට අයදුම් කළ හැකි වුවද, බොහෝ තනතුරු සඳහා ඔවුන්ට අයදුම් කිරීමට හැකියාවක් නොමැති අතර, එවැනි තනතුරු සඳහා බාහිරව බඳවා ගැනීමට සිදුවනු ඇත. | කළමනාකරණය විසින් කාර්ය මණ්ඩලය ඵලදායිව සේවයෙහි යොදවා අතිකාල වියදම් අඩු කර ගැනීමට කටයුතු කළ යුතු අතරම අතිකාල කලින් අනුමත කිරීම හා කල වැඩ වාර්තා පවත්වාගෙන යාමට ද කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 04 වන දින නෞකාවක් කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තයෙහි ගැටීම නිසා සිදුවූ අනතුර හේතුවෙන් ජය බහාලුම් පර්යන්තයේ ජල වාරකය (Caisson), | මෙම අනතුරෙන් හානි වූ වේග වලක්වන (Fenders) ප්‍රතිස්ථාපනය සිදු කර ඇත. අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය | හානිපූර්ණය සඳහා ලද වන්දි මුදල් භාවිතා කර සුදුසු පරිදි සැලසුම්කර අදාළ අළුත්වැඩියා |

| | | | |
|---|---|---|---|
| | වේග වළක්වනය (Fenders), වරාය වේදිකා බිත්තිය (Quay wall) යනාදියට හානි සිදුවී තිබුණි. එම හානිය රු. මිලියන 315.90 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එසේම ඉහත හානිය වෙනුවෙන් රු. මිලියන 384.42 ක මුදලක් 2019 දෙසැම්බර් 30 දින අධිකාරිය වෙත ලැබී තිබුණ ද වේග වළක්වනය හැර අනෙකුත් අළුත්වැඩියා කිරීමේ කටයුතු මෙතෙක් සිදුකර නොතිබුණි. | යන්ත්‍ර උපකරණ පහසුකම් අප සතුව නොමැති බැවින් එය සිදු කළ යුතුව ඇත්තේ බාහිර කොන්ත්‍රාත්කරුවෙකු සම්බන්ධ කිරීම මගිනි. කෙසේ වුවද, ජය බහලු පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සිදුවන බැවින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා අදාළ කොටසෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම හා රටතුළ පවතින අයහපත් ආර්ථික වාතාවරණය නිසා මෙහෙයුම් කටයුතු තාවකාලිකව නතර කිරීමට සිදු වේ. | කටයුතු අප්‍රමාදව සිදු කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | පරිශ්‍ර කුලී ණයගැති ශේෂය තුළ පවත්නා NFCL PENNA Port Storage (Pvt) Ltd ණයගැතියාගේ කල්බදු ගිවිසුම "දෙපාර්ශවය විසින්ම ගිවිසුම් කොන්දේසි කඩකිරීම" මත 2022 පෙබරවාරි 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අවලංගු කර 2022 නොවැම්බර් 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව නැවත ක්‍රියාත්මක කර තිබුණි. එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව කල්බදු ගිවිසුම නැවත ක්‍රියාත්මක කිරීමේදී අදාළ සමාගම විසින් අධිකාරිය වෙත රු. මිලියන 30 ක් ගෙවීමෙන් ණයගැති ශේෂ නිරවුල් කිරීමට තීරණය කර තිබුණ ද, ලැබිය යුතු මුළු මුදල වන රු. මිලියන 95 ක් තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022-11-30 දිනැති අංක-PAM/237/2022 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව NFCL PENNA PORT STORAGE (PVT) LTD (සිංහ සිමෙන්ති සමාගම) විසින් ගෙවිය යුතු රු.95,032,359.32 ක හිඟ මුදලින් රු.18,000,000.00 ක් සමහ ඇප තැන්පතුවක් වශයෙන් රු.12,000,000.00 වන පරිදි රු. 30,000,000.00 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවන ලෙස 2023-04-10 දින සමාගම වෙත දන්වා ඇත. රු.30,000,000.00 ක් පමණක් අයකර ගැනීමට තීරණය කළද මුළු හිඟ මුදලින් රු.18,000,000.00 අඩු කිරීමෙන් පසු ඉතිරි හිඟ මුදල වන රු.77,032,359.82 ක මුදල පොත් වලින් ලියා ඉවත් කිරීමට විගණන කමිටු අනුමැතිය හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මෙතෙක් ලබාගෙන නොමැති බැවින් ගිණුම්වල ගැලපීම් කිරීමට මෙතෙක් කටයුතු කර නොමැත. | හිඟ බදුකලී අයකර ගැනීමට අවශ්‍ය සියලු කටයුතු කිරීම හෝ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කිරීම සඳහා අධිකාරියේ නීති අංශය වෙත යොමු කළ යුතුය. |
| (ඇ) | අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිපාලිත සමාගමක් වන ලංකා ගෑස් ටර්මිනල් සමාගමෙහි මෙහෙයුම් කටයුතු සිදු නොවන බවට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබූ අතර 2023 මාර්තු 15 දින වන විටත් මෙම සමාගමේ ඉදිරි මෙහෙයුම් කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය විසින් තීරණයන් ගෙන ඒ අනුව ක්‍රියාකර නොතිබුණි. | එකඟ වේ.<br><br>මෙම සමාගම ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් වරාය අධිකාරිය විසින් තීරණයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. | මෙම සමාගම පිළිබඳ ඉදිරි කටයුතු ඉතා ඉක්මණින් සිදුකිරීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුදල් කාර්ය පරිපාටි සංග්‍රහයේ 9.3.1 වගන්තිය අනුව අධිකාරියට ලැබිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඍජුව හෝ අනියම් ලෙස වගකිව යුතු නිළධාරීන් ඒවා හිඟ මුදල් බවට පත්වීමට ඉඩ නොහරින බවට වගබලා ගැනීම සඳහා සෑම සැලකිල්ලක්ම දැක්විය යුතුය. එසේ වුවද, අංක පරිශ්‍ර/1/1/156/B දරන තොරතුරු ලිපියට අනුව කොළඹ වරායේ 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 155.9 ක හිඟ පරිශ්‍ර බදුකුලී ශේෂයක් පැවති බවට නිරීක්ෂණය වූ අතර මූල්‍ය අංශයේ වාර්තා අනුව ලැබිය යුතු බදුකුලී ආදායම රු. මිලියන 197.1 ක් විය. ඒ අනුව මූල්‍ය අංශය හා පරිශ්‍ර අංශය විසින් ලබාදුන් තොරතුරු අතර රු. මිලියන 41.2 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022.12.31 දිනට මුදල් කොට්ඨාශයේ වාර්තාවන්ට අනුව හිඟ පරිශ්‍ර බදු කුලී ශේෂය රු. 197,079,282 නිවැරදි වන අතර විගණන විමසුමෙහි පෙන්වා දී ඇති පරිශ්‍ර අංශයෙන් ලබා දී ඇති විස්තරයන්ට අනුව 2022.12.31 දිනට ශේෂය ලෙස දක්වා ඇති රු.155,912,330 ක ශේෂය සෑදී ඇත්තේ විවිධ දිනයන්ට අදාළ බිල්පත්වල ශේෂයන්ගෙන් බැවින් විමසුමෙහි පෙන්වා ඇති වෙනස ඇති වී තිබේ. කෙසේ වෙතත්, දැනට පවතින හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය දක්වමින් පරිශ්‍ර අංශය හා මුදල් කොට්ඨාශය එක්ව සැලසුමක් සකස් කරමින් පවතින අතර එය විගණන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ හිඟ මුදල් ඉක්මණින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ඊ) | විගණිත වර්ෂය තුළ ඉහත සඳහන් වෙළඳකුටි 21 ක බදු ගිවිසුම් ද 2023 මැයි 03 දිනැති ලිපිය මගින් සැපයූ තොරතරු අනුව තවත් වෙළඳකුටි 03 ක් ද ඇතුළුව වෙළඳකුටි 24 ක බදු ගිවිසුම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කිරීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි. | විගණන ඡේදයේ සඳහන් වෙළඳකුටි අතරින් 16 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර ඇති අතර, ඉතිරි වෙළඳකුටි 08 සඳහා ද ඉතා ඉක්මනින් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිසි පරිදි බදු ගිවිසුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු සිදුකළ යුතුය. |
| (උ) | අධිකාරිය විසින් කල්බදු ගැනුම්කරු සමග බදු ගිවිසුමක් රහිතව ආයෝජන දේපල ලෙස පවත්වාගෙන යනු ලබන ඉඩම් කැබලි 10 ක් නිරීක්ෂණය වූ අතර බදු ගිවිසුමක් නොමැති වීම නෛතික අවශ්‍යතාවයකදී අධිකාරියට ගැටළුකාරී විය හැක. | ඩිස්ටිලරීස් සමාගම වෙත බදු පදනම මත ලබා දුන් පරිශ්‍රයට යාබදව පිහිටා ඇති මෙම පරිශ්‍රය ඔවුන් විසින් තාවකාලිකව පරිහරණය කළ අතර මේ වන විට සමාගම විසින් භාවිතා නොකරන බැවින් බදු ගිවිසුමකට එළඹීම අවශ්‍ය නොවන අතර වරාය හා නාවික අමාත්‍යාංශය දිගු කලක සිට අධිකාරියට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර රු. 614,560/- ක මාසික බදු කුලියක් ගෙවනු ලැබුව ද බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොමැත. INSEE CEMENT සමාගම සමග ද බදු ගිවිසුමකට එළැඹීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නිසි පරිදි බදු ගිවිසුම්වලට ඇතුළත් වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | අධිකාරිය විසින් බදු දීමට හෝ වෙනත් ඵලදායී කාර්යයකට යොදාගැනීමට අපේක්ෂිත වුවත්, රු. මිලියන 3,997 ක් වටිනා ඉඩම් කැබලි 05 ක් මෙතෙක් අපේක්ෂිත අරමුණට යොදා නොගෙන පැවති බව 2022 දෙසැම්බර් 31 දිනට නිරීක්ෂණය විය. | ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ඉඩම් කොළඹ නගර සංවර්ධන සැළසුමට අනුව නාගරික සංවර්ධන අධිකාරිය සමග ඒකාබද්ධව සංවර්ධනය කිරීමට සිදුවී තිබේ.<br>කොම්පඤ්ඤවීදියේ පිහිටි කිව් පාරේ ඉඩම හා මෝගන් පාරේ ඉඩම යන ඉඩම් බේරේ වැව ආශ්‍රිත සංවර්ධන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වෙමින් පවතී.<br>මහර ගල්වල පිහිටි ඉඩමේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | අදාළ ඉඩම් නිශ්කාර්යව පවත්වානොගෙන ආදායම් උපයන කටයුතු සඳහා යොදා ගත යුතුය. |
| (එ) | 2022 මැයි 26 දිනැති අංක පරිශ්‍/4/විවිධ දරන ලිපිය ප්‍රකාරව අධිකාරිය සතුව නිල නිවාස 635 ක් පවතින අතර 2022 දෙසැම්බර් 31 දිනට පදිංචිය වසර 05 (2018 වර්ෂයට පෙර) ඉක්ම වූ නිල නිවාස 399 ක් හා වසර 05 ක් (2018-2022) ඇතුළත ලබාදුන් නිල නිවාස 205 ක් සමග මුළු නිල නිවාස 604 ක් උපයෝජනය වී ඇති අතර නිල නිවාස 31 ක් නිශ්කාර්යව පැවතුණි. | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිල නිවාස 635 ක ප්‍රමාණයෙන් ඉහළ කළමණාකාරිත්වයේ නිල නිවාස, විධායක නිළධාරී නිවස්න, ක්‍රීඩා සමාජය, සුභසාධක දාරකාගාරය, අළුත්වැඩියා කරීමට ඇති නිවාස වේ. කෙසේ නමුත් නිවාස පුරප්පාඩුවන විට එය සියළු නිවාස කඩිනමින් ඉල්ලුම්කරුවන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. | අදාල නිල නිවාස චක්‍රලේඛ ප්‍රකාරව උපයෝජනයට ගත යුතුය. |
| (ඒ) | ඉඩම් පිළිබඳ විගණනය | | |
| (i) | පිඹුරුපත් අංක LS/MIS/344 දරන කැනල් අංගනය (බටහිර) කොළඹ 01 කෙලින් වීදියට හා ඕල්කට් මාවතට මායිම් වන වටිනාකම රු. මිලියන 947.5 ක් වූ අක්කර 02 ක ඉඩම් රේගු දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ලබාදී තිබූ නමුත් නීත්‍යානුකූලව එම ඉඩම පවරාදීම හා වටිනාකම පොත්වලින් ඉවත් කිරීම මෙම වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි. | කළමණාකරණය මෙතෙක් පිළිතුරු ලබාදී නොමැත. | විධිමත් ක්‍රමවේද අනුව එකඟතාවයකට පැමිණ ඉඩම් පවරා දීමේ කටයුතු සිදුකර අදාල වත්කම පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) | පිඹුරුපත් අංක CO/COL/2012/1047 දරන කොළඹ 10 ඩී.ආර්.විජේවර්ධන මාවතේ පිහිටි වටිනාකම රු. මිලියන 628.5 ක් වූ අක්කර 2 රූඩ් 3 පර්චස් 9.61 ක් වූ ඉඩම නෙළුම් කුළුණ ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත භුක්තිය භාරදී තිබුණ ද විධිමත් ක්‍රියාමාර්ග අනුව වටිනාකම රෙජිස්ටරයෙන් ඉවත් කර, හිමිකම් ඔප්පුවක් මගින් ඉඩම පවරාදී නොතිබුණි. | කළමණාකරණය මෙතෙක් පිළිතුරු ලබාදී නොමැත. | විධිමත් පරිදි ඉඩම් පවරා දීමේ කටයුතු සිදුකර අදාල වත්කම පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | පිඹුරුපත් අංක S/P/183F දරන 601 වත්ත සිරිල් සී පෙරේරා මාවතේ පිහිටි වටිනාකම රු. මිලියන 83.723 ක් වූ අක්කර 01 රූඩ් 02 පර්චස් 14.9 ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරි වෙත පවරාගෙන ඇති නමුත් නීත්‍යානුකූල භුවමාරුවීම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් වී නොතිබූ බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් අධිකාරියේ ඉඩම් වටිනාකම රු.මිලියන 83.723 කින් අධිගණනය වී තිබුණි. | කළමණාකරණය මෙතෙක් පිළිතුරු ලබාදී නොමැත. | ඉඩම් පවරාදීමෙන් පසු භුවමාරු කිරීමේ කටයුතු නීත්‍යානුකූලව අවසන් කර අදාල ඉඩම ඉඩම් රෙජිස්ටරයෙන් ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උතුරු නැගෙනහිර පිවිසුම් කලාප සංකල්පය සාක්ෂාත් කරගැනීමේ අරමුණින් කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු එක්සිම් බැංකුව සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 45.27 ක ණය මුදලක් ලබා ගැනීමට 2018 ජනවාරි 10 දින ගිවිසුම් ගත වී තිබුණි. නමුත් එම ණය මුදල ප්‍රමාණවත් නොවේ යැයි පුරෝකථනය කර ඇ.එ.ජ ඩොලර් මිලියන 16.23 ක අතිරේක මුදලක් සමඟ ඇ.එ.ජ ඩොලර් මිලියන 61.5 ක් දක්වා එම ණය මුදල ඉහළ නංවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ඉන්දියානු රජය එය අනුමත කර නොතිබුණි. ණය ගිවිසුම අත්සන් කර වසර 05 ක් ගතවී තිබුණ ද වරායෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේම ණය මුදලින් ඇ.එ.ජ ඩොලර් මිලියන 0.905 (ඇ.එ.ජ ඩොලර් 905,194.38) ක් පමණක් වැයකර තිබුණු අතර ලබා නොගත් ණය සඳහා කැපකිරීමේ ගාස්තු (Commitment charges) ලෙස ඇ.එ.ජ ඩොලර් 21,139.78 (රු.5,838,633.73) ක මුදලක් සහ ණය පොළිය ලෙස ඇ.එ.ජ ඩොලර් 20,937.57 (රු. මිලියන 6.1) ක මුදලක් ද අධිකාරිය විසින් අනාර්ථික වියදම් ලෙස දරා තිබුණි. | එකඟ නොවේ. 2018 ජනවාරි මස 10 දින ශ්‍රී ලංකා රජයට හා ඉන්දියාවේ EXIM එක්සිම් බැංකුව අතර අත්සන් කරන ලද ඩොලර් ණය සහන ගිවිසුමට අනුව, වගකීම් ගාස්තුව හා පොළී ගාස්තුව ශ්‍රී ලංකා රජය විසින් EXIM බැංකුව වෙත ගෙවිය යුතුය. මෙම ගෙවීම් ගෙවන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුව නිර්දේශ කර ඉදිරිපත් කළ පසු, අදාළ වගකීම් ගාස්තු හා පොළී ගාස්තු ගෙවීමට කටයුතු කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වගකීම වන අතර, එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය පාලනයෙන් තොරවූ කරුණකි. | යථාර්ථවාදී වන පරිදි සැලසුම් සකස් නොකිරීම හා සැලසුම්ගත පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා බැඳීම් ගාස්තු හා මිල විචලනයන් වැනි අනාර්ථික වියදම් දැරීමට සිදු වන නිසා සැලසුම් හැකිතාක් පරිදි යාථාර්තවාදී විය යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය 2022 වර්ෂයේ ආරම්භ කරන ලද මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ මහ නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම (Maga Neguma Road Construction Equipment Company) අතර ඇතිකරගත් කොන්ත්‍රාත් ගිවිසුමෙහි 1.6 වගන්තිය අනුව දෙපාර්ශවය එකඟ වූ වෙනත් ක්‍රමයක් නැතිනම් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පිළිගැනීමේ ලිපිය ලැබීමෙන් පසු දින 28 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ යුතුය. කොන්ත්‍රාත්තුව 2021 අප්‍රේල් 06 දින අත්සන් කළ යුතු වුවද, 2021 අගෝස්තු 18 දින කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීම සඳහා දින 122 ක ප්‍රමාදයක් සිදුවී තිබුණි. | ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අදාළ කොන්ත්‍රාත්කරු වෙත පැවරීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ගිවිසුම් සකසනු ලැබේ. එම ගිවිසුමේ සැලැස්ම අධිකාරියේ නීති අංශය මගින් සිදුකරන සංශෝධන ඇතුළත් කර, නැවත නීති කොට්ඨාශය හරහා මාණ්ඩලික අනුමැතියට යොමු කරයි. ඉන් අනතුරුව කොන්ත්‍රාත්කරු හා වරාය අධිකාරිය අතර ගිවිසුම් අත්සන් කරනු ලබයි. කොරෝනා අවදානම පැවති කාලයේදී වරාය අධිකාරිය ඇතුලු සියලුම රාජ්‍ය ආයතන අවම සේවක සංඛ්‍යාවක් සහිතව පවත්වා ගැණිනි. එම හේතුව නිසා ගිවිසුම් ගතවීමේදී ප්‍රමාදයක් සිදුවී ඇත. | නියමිත පරිදි කඩිනමින් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කළ යුතුය. |
| ii. කොන්ත්‍රාත් ගිවිසුමෙහි 4.14 වගන්තිය අනුව කොන්ත්‍රාත්කරු විසින් මාසික ප්‍රගති වාර්තා පිළියෙල කර පිටපත් දෙකකින් යුක්තව අධිකාරියේ ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියෙහි මාසික ප්‍රගති වාර්තා විධිමත් ලෙස පිළියෙල කර වරාය අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම කොන්ත්‍රාත්තුව ආරම්භ කර මාස 18 ක් ගතවී තිබුණ ද මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම පවත්වා තිබුණේ මාස 03 ක පමණි. විධිමත් ලෙස පිළියෙල කරන ලද ප්‍රගති වාර්තා පදනම් කර ගනිමින් මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් අඛණ්ඩව නොපැවැත්වීම ද මෙම කොන්ත්‍රාත්තුව නිම කිරීම ප්‍රමාදවීමට හේතු වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය කිරීමේදී සෙරන්ඩිබ් පාන්පිටි (Serendib Flour Mills) නිෂ්පාදනාගාරයට විදුලිය ගෙනයන ප්‍රධාන විදුලි සැපයුම පලුදු වීම නිසා නිෂ්පාදන බිඳ වැටිණි. නැවත එම කටයුතු යථා තත්ත්වයට ගෙන ඒමට වරාය අධිකාරිය ක්‍රියා කරන ලදී. මෙම රැහැනට හානියක් සිදුවුවහොත් එයට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින්, වරාය අධිකාරියේ විදුලි අංශයේ අධීක්ෂණය යටතේ පමණක් අදාළ කේබල් ගොඩනැගීම සිදුවිය. වැඩ වාර ලේඛණයට අනුව සේවකයින් කැඳවූ බැවින් සහ ඒ සඳහා අවශ්‍ය අධීක්ෂණ නිළධාරීන්ගේ ප්‍රමාණය අඩුවීමත්, කොරෝනා වසංගත තත්ත්වය මත පැනවූ ගමනාගමන සීමා නිසාත් ඉහත කටයුත්ත සඳහා අධික කාලයක් ගතවිය. | නිසි පරිදි ප්‍රගති වාර්තා අදාළ කාලසීමාව තුළ සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | iii. කොන්ත්‍රාකරු විසින් 2021 මැයි 19 දින ඉදිරිපත් කරන ලද සංශෝධිත කොන්ත්‍රාත් සැලැස්මට අනුව ව්‍යාපෘතිය 2022 ජනවාරි 30 දින අවසන් කළ යුතු වුවද, ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු 2022 සැප්තැම්බර් 30 දින නතරවී තිබුණු අතර 2022 අගෝස්තු 30 දිනට ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය සියයට 21.2 ක් පමණ අවම මට්ටමක පැවතුණි. | ව්‍යාපෘතිය නිම කිරීමට අවස්ථා 2 කදී දීර්ඝ කිරීම සිදුකළ අතර ඒ සඳහා අමතර ක්‍රියාකාරකම්, රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය, සේවකයින් කොරෝනා රෝගයට ගොදුරුවීම සහ නිරෝධායනය කිරීම සැළකිල්ලට ගන්නා ලදී. තවද, සෙරන්ඩිබ් පිටි නිෂ්පාදනාගාරයට විදුලිය සපයන ප්‍රධාන විදුලි සැපයුම බිඳවැටීම, පෙර හඳුනා නොගත් ජල සැපයුම් නළ, තෙල් ගෙනයාමේ නළ ජලය බැසයාමේ කානු පද්ධතිය සඳහා අමතර කාලයක් ගතවිය. | සියළු ව්‍යාපෘති කොන්ත්‍රාත් කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| | iv. කොන්ත්‍රාකරු විසින් ව්‍යාපෘතිය නිම කිරීමේ කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කරගෙන තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතියේ 2022 ජූනි 30 දින අවසන් විය යුතු වුවද, එම කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි යාවත්කාලීන කරන ලද දියත්කිරීමේ සැලැස්මක් (Updated implementation plan) කොන්ත්‍රාකරු අධිකාරිය වෙත ලබාදී නොතිබුණු අතර එවැනි සැලැස්මක් ලබාගැනීමට ද අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත් නිමකිරීමේ කාලය දීර්ඝ කිරීම පිළිබඳව (Time Extension) කොන්ත්‍රාත්කරුට ඉදිරිපත් කරන ලද ලිපි මගින් යාවත්කාලීන කරන ලද දියත් කිරීමේ වැඩ සැලැස්මවල් වරාය අධිකාරිය විසින් ඉල්ලා ඇති අතර, කොන්ත්‍රාත්තුව අතරතුර සිදු වූ අමතර අවිනිශ්චිත වැඩ හා කොන්ත්‍රාත් අමුද්‍රව්‍යවල අධික මිළ ඉහළයාම නිසා කොන්ත්‍රාත් වැඩ තාවකාලිකව නැවැත්වීම හේතුවෙන් එසේ ඉල්ලන ලද වැඩ සැලැස්මවල් ඉදිරිපත් කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව ඇත. | ව්‍යාපෘති දීර්ඝ කිරීම සිදු කරනු ලබන්නේ නම් අදාළ යාවත්කාලීන කරන ලද දියත්කිරීමේ සැලසුම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ සියළු ගේට්ටු සහ බන්ධිත ගුදම් සඳහා CCTV කැමරා සවිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.මිලියන 960 ක් අධිකාරියේ වාර්ෂික අයවැයෙන් වෙන්කර තිබුණු අතර 2021 වර්ෂයේ ප්‍රතිපාදිත මුදල වෙනත් කටයුත්තකට යොදවා තිබුණි. කෙසේ වුවද, 2022 වර්ෂය අවසානවන විටත් CCTV කැමරා සවිකිරීමේ කාර්යය නිමකර නොතිබුණි. | අදියර කීපයක් යටතේ වරාය පිවිසුම් දොරටු සියල්ලම CCTV කැමරා පද්ධති කීපයක් මඟින් ආවරණය කිරීමට සැලසුම් සකස් කර ඇති අතර 2023 වර්ෂයේදී දොරටු අංක 1,2,3,4,5 සහ 8 සඳහා CCTV කැමරා පද්ධති සවි කිරීමට රු.මිලියන 10 ක මුදලක් 2023 වර්ෂයේ අයවැය මගින් වෙන්කර තිබූ අතර දැනට අංක 1A,1,2,3 සහ 6 යන දොරටු සඳහා CCTV කැමරා සවිකර තිබුණි. | අධිකාරියේ ආරක්ෂාවට ඉතා වැදගත්වන මෙවැනි ව්‍යාපෘතීන් අදාල කාල රාමුන් තුල නිම කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ජය බහලු පර්යන්තය සඳහා මිලදීගත්, දොඹකර තුනක් ECT හි සවි කර, එහි මෙහෙයුම් කටයුතු 2021 වර්ෂයේදී ආරම්භකර තිබුණ ද පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාවය උපරිම ලෙස උපයෝජනය කිරීම | ECT හි උපාංග සඳහා ගෙවිය යුතු අත්තිකාරම් මුදල වූ ඇ.එ.ජ.ඩො. මිලියන 56.51 ක් 2022.08.24 ද, අත්තිකාරම් මුදලට අමතරව පලමු වාරිකය වූ ඇ.එ.ජ.ඩො. මිලියන | අධිකාරියේ කාර්යසාධනයට වැදගත්වන මෙවැනි ව්‍යාපෘතීන් අදාල කාල රාමුන් තුල නිම |

| | | | |
|---|---|---|---|
| | සඳහා විශාල පරිමාණයේ දොඹකර (STS Cranes) 12 ක් හා රේල් පීලි මත සවිකර ක්‍රියාකරන ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර (ARMG Cranes) 40 ක් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ඇ.එ.ජ.ඩො. මිලියන 282.56 ක සැපයුම් කොන්ත්‍රාත්තුවක් 2021 දෙසැම්බර් 18 දින ප්‍රදානය කර 2021 දෙසැම්බර් 20 දින ගිවිසුමට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ඇ.එ.ජ.ඩො. මිලියන 56.51 ක් එකවර 2022 ජනවාරි 20 දින වන විට ගෙවිය යුතු නමුත් එය කොටස් වශයෙන් 2022 අගෝස්තු 24 දින දක්වා ගෙවා තිබූ අතර, එම නිසා දොඹකරවල නිෂ්පාදන කටයුතු ප්‍රමාදවී ආරම්භ කර තිබුණි. | 56.51 ක් 2023.03.17 දින වන විට ගෙවා ඇති අතර මේ වන විට දොඹකර නිෂ්පාදන කටයුතු ආරම්භ කර සියයට 20 ක ප්‍රගතියක් ළඟා කරගෙන ඇත. | කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අධිකාරිය මගින් දැනට ප්‍රධාන මෙහෙයුම් කටයුතු සිදු කරන ජය බහාලුම් පර්යන්තයේ (JCT) හි දිග මීටර් 600 ක් පමණක් වීම නිසා එම පර්යන්තය මීටර් 120 කින් දීර්ඝ කිරීමට සහ ගැඹුර මීටර් 15 ක් ලෙස නැව්තොට සකස් කිරීමට 2017 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු අතර 2018 නොවැම්බර් 29 දින චීන සමාගමක් සමග ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 5,035.30 (VAT රහිත) ක් විය. ගිවිසුම අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 42 ක් පමණක් විය. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2020 අප්‍රේල් 09 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණද පසුව කොවිඩ් 19 තත්ත්වය හා රටේ පැවති තත්ත්වය හේතුවෙන් 2022 ජූලි 23 දිනට ව්‍යාපෘතිය නිම කිරීම සඳහා එකඟවී තිබුණි. නමුත් නැවත 2023 ජූලි 31 දක්වා ව්‍යාපෘති කාල සීමා දීර්ඝ කිරීමක් ලබා දී ඇති නමුත් 2023 ජූලි 07 දිනට භෞතික ප්‍රගතිය සියයට 60 ක් වී තිබුණි. | අධිකාරියේ කාර්යසාධනට වැදගත්වන මෙවැනි ව්‍යාපෘතීන් අදාල කාල රාමුන් තුල නිම කිරීමට කටයුතු කල යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ආ) සහ 2.3.2 (ඇ), 2.6.1 (අ) (ii), 5.1.1 (අ) සහ 5.2.1 (අ) වගන්ති අනුව ප්‍රසම්පාදන ක්‍රියාවන් භාරව සිටින නිලධරයන් විසින් පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම, ඒවා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම කළයුතු අතර පිරිවිතර සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් කළ යුතුය. එසේ වුවද, මුළුතැන්ගෙහි ආහාර ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිලදීගැනීමේදී ඉහත | මධ්‍යම මුළුතැන්ගෙවල් අංශය විසින් 2022 වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී ටෙන්ඩර් මණ්ඩලයක් හා ඇගයීම් කමිටුවක් පත්කර අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවන් සිදු කර තිබුණද ලිපියේ සඳහන් පරිදි පිරිවිතර ඇතුළු ලංසු ලේඛන කෙටුම්පත් සකස් කිරීම, ඒවා සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම සඳහා තාක්ෂණික ඇගයීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කර නොතිබුණි. එහෙත් මාළු සඳහා පමණක් යම් පිරිවිතර සීමාවක් දක්වා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විධිවිධාන ප්‍රකාරව අධිකාරිය කටයුතු කර නොතිබුණි. | තිබුණි. මෙය රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනි බව පිළිගන්නා අතර එය අපගේ ප්‍රමාද දෝෂයකි. 2023 වර්ෂයේ සිට මධ්‍ය මුළුතැන්ගෙවල් අංශය සඳහා සියළු මිලදීගැනීම්, සැපයුම් කොට්ඨාශය හරහා සිදුවන බැවින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි අදාළ ක්‍රියාවන් ඉදිරියේදී නිවැරදිව සිදුවනු ඇත. | |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යාතනය විසින් නිකුත් කළ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයෙහි 4 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනයන් සිදු කිරීමේදී මුළු වටිනාකම ඇස්තමේන්තුකර ඒ අනුව අමාත්‍යාංශ අතිරේක ලේකම් විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු පත් කිරීමේ ලිපිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටු පත්කර මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත් 2022 ජනවාරි සිට ජූනි මාසය දක්වා පිළිවෙලින් රු. මිලියන 44.9 ක් සහ රු. මිලියන 29.1 ක් වැය කර තිබූ කුකුල් මස් සහ කජු මද ප්‍රසම්පාදනයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉහත (අ) හි සඳහන් පරිදි ක්‍රමවේදයක් මුළුතැන්ගෙවල් අංශයේ මිලදී ගැනීම් සිදුකිරීමේදී භාවිතා කර නොතිබුණු අතර සේවකයන්හට අනුමත කරන ලද ආහාර වට්ටෝරුව අනුව මිලදී ගැනීම් සිදු කර ඇත. 2023 වර්ෂයේ සිට සැපයුම් කොට්ඨාශය මගින් සියළු ප්‍රසම්පාදන කටයුතු සිදු වන බැවින් වාර්තාවේ සඳහන් අඩු පාඩු නිවැරදි වනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිකාරියේ පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ (x) වන පරිච්ඡේදයේ III වන කොටසෙහි මුළුතැන්ගෙවල් අංශයේ භාණ්ඩ මිලදී ගැනීමේ පටිපාටියෙහි 41 වන වගන්තිය ප්‍රකාරව හැකිතාක් දුරට තරඟකාරී මිල සලකා බලා රජයේ දෙපාර්තමේන්තු වලින් හෝ රජය සතු ව්‍යවසායන් වලින් මිලදී ගත යුතු බව සඳහන් වුවද, කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී එලෙස කටයුතු කර නොතිබුණි. | මෙහිදී, ඉහළ ගුණාත්මක බවින් යුක්ත (High quality) හා ඉහළ සනීපාරක්ෂිත (Hygiene) බේකරි ආහාර ලබා ගැනීමේ හැකියාව සළකා බලා, බේකරි අයිතම නිෂ්පාදන කටයුතු බාහිර පිලිගත් ආයතනයකට ලබා දීමටත්, ඒ සඳහා සම්මත විනිවිදභාවයෙන් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කිරීමටත් කළමනාකරණ කමිටුව තීරණය කරන ලදී. | අධිකාරියේ පරිපාලන කාර්යය සංවිධාන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතෙහි II කොටසේ 14 (2) වගන්තිය ප්‍රකාරව අධිකාරියේ මුදල් කළමනාකාරවරයා විසින් වියදම් පිළිබඳ සියලු මූල්‍ය බලපෑම් දැක්වෙන මුදල් විග්‍රහයක් ඉදිරිපත් කරනු ලබතහොත් මිස අධිකාරිය විසින් රුපියල් දස ලක්ෂයකට නොඅඩු මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් මුදල් ස්වභාවයේ තීරණ නොගත යුතු වුවද, එසේ ඇගයීමක් සිදු නොකර කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී පෙර පැවති මාසිකව මිල | මෙම ආහාර සැපයීමේ ක්‍රමවේදය හුදෙක් වරාය අධිකාරියේ සේවක මහතුන්හට ගුණාත්මක බවින් ඉහළ බේකරි නිෂ්පාදන ලබා දීමට සිදුකරනු ලැබූ අතර එහිදී මුල් මාස හය සඳහා වෙළඳපල පැවති මිළට සාපේක්ෂව සාධාරණ මිලකට බේකරි අයිතම ලබාගැනීමට හැකියාව තිබිණි. මෙම මූලික මිළ ගණන් යටතේ මාස හයක් සැපයුම්කරු වෙළඳපල මිළ වැඩිවීම නොසලකා | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගණන් කැඳවා බේකරි ආහාර ලබාගැනීමේ ක්‍රමය වෙනුවට අධිකාරියේ පරිශ්‍රය ඇතුළත ස්ථාපිත කරන ලද බේකරිය බාහිර අයතනයක් වෙත බද්දට ලබාදීම මගින් වර්ෂ 05 ක් දක්වා බේකරි නිෂ්පාදන මිලට ගැනීම සිදු කර තිබුණි. තවද, අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමේ කොන්දේසි මාලාවේ 3 වන වගන්තිය අනුව කටයුතු නොකිරීම මත ප්‍රසම්පාදනයේදී ඇතිවන වෙළඳපල තරඟකාරීත්වයේ ප්‍රතිලාභ නැවත වසර 05 ක් යනතෙක් අධිකාරියට ලබාගැනීමේ හැකියාව අහිමි වී තිබුණි. | බේකරි නිෂ්පාදන වරාය අධිකාරියට සැපයිය යුතු අතර, ඉන් පසු සෑම මාස හයකටම වරක් වෙළඳපල ඒ ඒ අවස්ථාවල පවතින මිළ ගණන් අනුව තවත් ඉදිරි මාස හයක කාලයක් සඳහා මිළ ගණන් තීරණය කිරීම සිදුවේ. මේ සඳහා වරාය අධිකාරිය විසින් අධීක්ෂණ කමිටුවක් පත් කිරීමට ද නියමිතය. . | |
| (ඉ) | කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළකළ පුවත්පත් දැන්වීමෙහි ලංසු කැඳවීමේ ලේඛන මිලදී ගැනීමේදී ගෙවිය යුතු ආපසු නොගෙවන ගාස්තුව රු.25,000 ක් ලෙස සඳහන්ව තිබූ අතර එය සිංහල මාධ්‍යයෙන් පළකළ පුවත්පත් දැන්වීමෙහි රු.25,000.000.00 ක් ලෙස මුද්‍රණ දෝෂයක් සහිතව සඳහන්ව තිබුණි. එය නිවැරදි කර ප්‍රසිද්ධ කිරීමක් කර නොතිබුණි. මේ නිසා බහුලව භාවිතා කරන සිංහල මාධ්‍ය දැන්වීමෙහි ඉතා අධික ආපසු නොගෙවන තැන්පතුවක් දැක්වෙන ආකාරයට සඳහන් කිරිම අපේක්ෂිත ලංසුකරුවන් අධෛර්යමත් කිරිමට හේතුවක් වී තිබුණි. | මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ඉංග්‍රීසි මාධ්‍ය දැන්වීම අප විසින් සකස් කරනු ලබන අතර, එහි සිංහල හා දෙමළ පරිවර්තන අදාළ පුවත්පත් ආයතන වලින් සිදු කරනු ලබයි. සිංහල මාධ්‍යයේ දැන්වීමේ ඉතා විශාල ආපසු නොගෙවන තැන්පතුවක් ලෙස මුද්‍රණ දෝෂයක් පවතින බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත්, වෙනත් කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව යෝජනා ලියකියවිලි පරීක්ෂණයක් සිදුකළ හැකි බවත්, විමසීම් සඳහා දුරකථන අංකයක් සඳහන් නිසාත්, මෙම අසාමාන්‍ය මුදල නිවැරදි කර ගැනීමට අවස්ථාව පැවතිණ. කෙසේ වෙතත් මෙම මුද්‍රණ දෝෂය අවධානයට ලක්වීමකින් තොරව පැවති ඇති බවට එකඟ වේ. | පුවත්පත් දැන්වීම් පලකිරීමේදී ඒවාවල නිරවද්‍යතාව ඉතාම සැලකීමෙන් පරීක්ෂා කළ යුතු අතර වරදක් ඇත්නම් ඒවා නිවැරදි කිරීම් කර පල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී සැපයුම්කාර ආයතනය සමග බේකරි නිෂ්පාදනවල මිල සෑම මාස හයකට වරක් සාමාන්‍ය වෙළඳපළ මිල අනුව සංශෝධනය කළ යුතු බවට ගිවිසුම්ගතව තිබූ අතර අධිකාරිය දිනකට බේකරි ආහාර ඒකක 4000 ක පමණ තොගයක් මිලදී ගන්නා ආයතනයක් වුවද, බේකරි ආහාර ද්විත්ව කවර ක්‍රමය යටතේ ලංසු කැඳවීම් කර තෝරා ගැනීමේදි මිල ප්‍රධාන නිර්ණායකයක්වී නොතිබූ අතර, මිල සංශෝධනයන්වලදී ද තොග මිල සැලකිල්ලට ගන්නා පරිදි ගිවිසුමේ කොන්දේසි සකස් කර නොතිබුණි. බේකරි | බේකරි නිෂ්පාදකයන්ගේ මිල සංශෝධනය සිදු කරන කාල වකවානුව හා ඊට මාස 10 කට පෙර අදාළ අමුද්‍රව්‍ය සඳහා පැවති මිල සංසන්දනය කර මිල ගණන් ඉහළ යාම, වෙළඳ පොලෙහි එකී බේකරි නිෂ්පාදනයන් සඳහා පැවති මිල ගණන් යනාදියද සැලකිල්ලට ගෙන මිල සංශෝධනය සිදු කර ඇත. එකවර බේකරි නිෂ්පාදන ආයතනය විසින් තොගයක් ලෙස කෙටි ආහාර සැපයීම සත්‍ය වුවද මධ්‍යම මුළුතැන්ගෙවල් අංශය වෙත ලබාදිය | මෙවැනි විශාල ප්‍රමාණයන් මිලදී ගැනීමේදී තරඟකාරී මිලක් ලබාගැනීමට හැකි සෑම විටම කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආහාරවල මිල සංශෝධනය සම්බන්ධයෙන් අධිකාරිය සිදුකළ බේකරි නිෂ්පාදන වර්ග වෙළඳපලේ අලෙවි කරනු ලබන මිල ගණන් අධ්‍යයනයට අදාළ විශ්ලේෂණ වාර්තාවට අනුව බේකරි අහාර වර්ග 63 කින් අයිතම 20 ක වෙළඳපළ තොග මිල සැලකිල්ලට නොගෙන සිල්ලර මිල සැලකිල්ලට ගෙන තිබුණි. | යුතු ප්‍රමිතිය අනුව වෙළඳපොලෙහි පවතින එම නිෂ්පාදනයන්ගේ බරට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි බරකින් යුතුව එම අහාර සැපයීම සිදු කළ යුතු හෙයින් වෙළඳපොලෙහි තොග මිල සැලකිල්ලට ගැනීම සාධාරණ නොවේ. | |
| (ඇ) | කෙටි ආහාර සැපයීමේ ප්‍රසම්පාදනයේදී සැපයුම්කාර ආයතනය සමග ඇතිකරගත් ගිවිසුමෙහි 20 වන වගන්තිය අනුව බේකරි ආහාර සඳහා අධිකාරිය විසින් පත්කරන ලද ප්‍රමිති පරීක්ෂා කිරීමේ කමිටුවක් (QVC) මගින් බේකරි ආහාරවල ප්‍රමිතිය පිළිබඳව මාස 03 කට වරක් හෝ කිසියම් පැමිණිල්ලක් මත පරීක්ෂාවට ලක්කළ යුතු බව සඳහන්ව තිබුණ ද, 2022 සැප්තැම්බර් 28 දින දක්වා එවැනි පරීක්ෂාවකට ලක්කර අදාළ කමිටුවෙහි සාමාජිකයන් විසින් වාර්තාවක් ලබාදී නොතිබුණි. | මුළුතැන්ගෙවල් කටයුතු විධිමත් කිරීමේ කමිටුව මගින් බේකරි නිෂ්පාදන ආයතනයේ නිෂ්පාදනයන්ගේ ප්‍රමිතිය පිළිබඳව නිරන්තරයෙන් කටයුතු කර ඇති අතර ප්‍රමිති පරික්‍ෂා කිරීමේ කමිටුවක් (QVC) කඩිනමින් නම් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ පරීක්ෂා කිරීම් නියමිත පරිදි සිදුකළ යුතුය. |

### 3.5 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය වෙත කුලී පදනම මත වාහන සැපයීම වෙනුවෙන් නිකුත් කර ඇති උපදෙස් සහ කොන්දේසි මාලාවේ විශේෂ කොන්දේසි යටතේ වූ 08 වන වගන්තිය අනුව සපයනු ලබන වාහනය ලියාපදිංචි වර්ෂයේ සිට අවුරුදු 08 ක් නොඉක්මවිය යුතු අතර සැපයීමට බලාපොරොත්තු වන වාහනය ඉතා හොඳ තත්ත්වයේ තිබිය යුතු බව දක්වා ඇතත් 2022 වර්ෂය තුළ ලියාපදිංචි වර්ෂයේ සිට අවුරුදු 08 ක් ඉක්ම වූ වාහන 10 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. | ලියාපදිංචි වර්ෂය අවුරුදු 08 ක් නොඉක්මවිය යුතු වුවද, හොඳ තත්ත්වයේ වාහන සැපයීමට කොන්ත්‍රාත්කරුවන්ට නොහැකි වූ අතර ඔවුන් ප්‍රකාශ කර සිටියේ රට තුළ ක්‍රියාත්මකව තිබූ මෝටර් රථ ආනයනය සීමා කිරීම ඊට හේතු වූ බවයි. එබැවින් 2022 වර්ෂය සඳහා ලියාපදිංචිය වසර 18 ක් දක්වා දීර්ඝ කර වාහන ලබාගැනීමට තීරණය කරන ලදී. | අදාළ ලියාපදිංචි වර්ෂ තුළට ඇතුළත් වාහන පමණක් කුලී පදනම මත ලබාගැනීමට කටයුතු කළ යුතුය. |